වාර්ෂික වාර්තාව

வருடாந்த அறிக்கை

Annual Report

2020



ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය

இலங்கை அபிவிருத்தி நிருவாக நிறுவகம்

Sri Lanka Institute of Development Administration

2020

වාර්ෂික වාර්තාව

ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය



වාර්ෂික වාර්තාව - 2020

ප්‍රකාශනය
ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය

අංක 28/10, මළලසේකර මාවත, කොළඹ 07, ශ්‍රී ලංකාව.
+94 112 697 934 | info@mos.gov.lk

Printed with VOC free, non toxic vegetable oil-based environmentally-friendly ink, on 100% recycled paper using wood free pulp which is made from 100% post consumer waste paper (Paper recycling is the process of recovering waste paper and remarking it into new paper products.)

Recycling one ton of paper saves17 mature trees, 26 m3 of water, 2.3 m3 of disposal space, 320 liters of oil, and 4,100 kilowatt-hours of electricity.

We encourage you to recycle this Document after use.

ප්‍රින්ටෙක් එස්ටැබ්ලිෂ්මන්ට් පුද්ගලික සමාගම



අප ගැන...

ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය (SLIDA) යනු රාජ්‍ය පරිපාලන හා කළමණාකරණය පිළිබඳ දැනුම හා කුසලතා වර්ධනය කිරීම සඳහා ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම රාජ්‍ය අංශයේ පුහුණු ආයතනයයි. කළමනාකරණ පුහුණුවලට අමතරව කළමනාකරණ උපදේශන සේවා සැපයීම හා පර්යේෂණ කළමනාකරණයට අදාල සේවා සැපයීම මෙන්ම ආයතනික කළමනාකරණ ක්‍රමවේදයන් සමාලෝචනය හා වැඩිදියුණු කිරීම ද මෙම ආයතනයේ කාර්‍යභාරයට අයත් වේ. මෙය 1982 අංක 09 දරණ පාර්ලිමේන්තු පනත යටතේ පිහිටුවනු ලැබූ ආයතනයකි.



පටුන

පිටුව

1. **වඩා යහපත් හෙට දවසක් උදෙසා රාජ්‍ය අංශය සවිබල ගැන්වීම** **6**
   - දැක්ම 6
   - මෙහෙවර 6
   - උපාය මාර්ගික අරමුණු 7
   - මූලික කාර්යයන් 7
   - අපගේ අගනාකම් 7
   - උපාය මාර්ගික අභිප්‍රායන් 7
   - රාජ්‍ය සේවා පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම් හා ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ පාලක සභාවේ සභාපතිවරයාගේ පණිවිඩය 8
   - අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවිඩය **9**

2. **මූල්‍යමය තොරතුරු** **12**

3. **පාලක සභාවේ සාමාජිකයින්** **18**

4. **ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය හා අධ්‍යනේන්ද්‍රීය** **19**

5. **කෘත්‍යාත්මක හා සංවිධානාත්මක ව්‍යුහය** **26**
   - 5.1 ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ කෘත්‍යාත්මක ව්‍යුහය 26
   - 5.2 ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ සංවිධානාත්මක ව්‍යුහය 27

6. **අධ්‍යක්ෂ ජනරාල්ගේ සමාලෝචනය** **28**
   - ඉගෙනුම් සහ සංවර්ධන වැඩසටහන් - 2020 28
   - 6.1 සේවාරම්භක පුහුණු වැඩසටහන් 28
   - 6.2 දීප ව්‍යාප්ත සේවාවන් සඳහා අනිවාර්ය ඉගෙනුම් සහ සංවර්ධන වැඩසටහන් 29
   - 6.3 නිපුණතා සංවර්ධන වැඩසටහන් 29
   - 6.4 ඩිප්ලෝමා වැඩසටහන් 30
   - 6.5 ඉල්ලුම් ප්‍රකාර සම්පාදිත ඉගෙනුම් සහ සංවර්ධන වැඩසටහන් 30
   - 6.6 කලමනාකරණ උපදේශන 31



7. පශ්චාත් උපාධි අධ්‍යයන පාසල **32**

8. 2020 වර්ෂය තුළ පවත්වන ලද විභාග **34**

9. තොරතුරු තාක්ෂණය සඳහා වන මධ්‍යස්ථානය **36**

10. භාෂා අධ්‍යයනය සඳහා වන මධ්‍යස්ථානය (CLS) **39**

11. සාමාන්‍ය පරිපාලනය **40**

11.1 සේවක සංඛ්‍යා කළමණාකරණය 40

11.2 මානව සම්පත් කළමණාකරණය 40

11.3. සැපයුම් කළමණාකරණය 41

12. ආචාර්ය එස්.එස් වනසිංහ පුස්තකාලය **43**

13. 2020 වර්ෂය තුළ ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ විශේෂ සිදුවීම් **45**

I. "හැදෙන රටක් වැඩෙන ගසක්, 45

II. ප්‍රසිද්ධ දේශනය 45

III. "පුද්ගලික අංශයේ මනා පරිචයෙන් රාජ්‍ය අංශයට ලද හැකි ආදර්ශය" පිළිබඳ ආරාධිත දේශනය. 45

IV. ශ්‍රී ලංකා ක්‍රම සම්පාදන සේවයේ නිලධාරීන් සඳහා නව පත්වීම් ප්‍රදානය කිරීම 46

V. "කොවිඩ් - 19 වසංගත කාල සීමාව තුළ රාජ්‍ය අංශයේ කළමණාකරුවන්ගේ කාර්යභාරය" යන මාතෘකාව යටතේ පවත්වන ලද වෙබ් සම්මන්ත්‍රණය 47

VI. වසංගත කාල සීමාව තුළ අඛණ්ඩ සේවාවක් සැපයීම 48

VII. ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් තනතුර 50

Viii. "රට වෙනුවෙන් වැඩ කිරීමේ සංස්කෘතියක්" යන මැයෙන් වූ ආරාධිත දේශනය 51

ix. ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය සිය හරිත උද්‍යානයේ ඖෂධ පැල සිටුවමින් "සුව ධරණි" ජාතික වැඩසටහනට දායක වීම. 51

14. විගණන කමිටුවේ වාර්තාව **52**

1. වඩා යහපත් හෙට දවසක් උදෙසා රාජ්‍ය අංශය සවිබල ගැන්වීම

ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය (ශ්‍රී.ලං.සං.ප/SLIDA), 1982 අංක 9 දරන පනත මඟින් රාජ්‍ය පරිපාලන විෂය භාර අමාත්‍යාංශය යටතේ 1982 මැයි මස දී සංස්ථාපිත කරන ලද ආයතනයකි. එය, රාජ්‍ය සේවයේ විධායක නිලධාරීන්ගේ ශක්‍යතා වර්ධනය සහ වෘත්තීය සංවර්ධනය කිරීමෙහිලා වගකීම පවරන ලද ප්‍රමුඛතම ජාතික ආයතනය වේ.

ජනතා අභිලාෂයන් සාක්ෂාත් කිරීමෙහිලා ඉටුකරනු ලබන සිය උත්තුංග මෙහෙවර අතර රාජ්‍ය අංශයේ නිලධාරීන් සඳහා පුහුණු පාඨමාලා පැවැත්වීම, රාජ්‍ය අංශයේ ආයතන සඳහා කළමණාකරන උපදේශන ලබා දීම සහ පර්යේෂණ කටයුතුවල නිරත වීම සදහා රාජ්‍ය අංශයේ නිලධාරීන් දිරි ගැන්වීම ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ ප්‍රධාන කර්තව්‍යන් වේ.

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයට පශ්චාත් උපාධි මට්ටමේ උපාධි පිරිනැමීමේ බලය ලබාදී ඇත. ඒ අනුව ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ පශ්චාත් උපාධි අංශය මඟින් රාජ්‍ය කළමණාකරණය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය සහ රාජ්‍ය කළමණාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා ප්‍රදානය කරනු ලබයි. අමාත්‍යාංශ ලේකම්වරුන්, ප්‍රධාන විධායක නිලධාරීන් සහ අනෙකුත් පාර්ශ්ව කරුවන් විසින් සිය කළමණාකරුවන් වෙතින් සුවිශේෂ දායකත්වයක් අපේක්ෂා කරන්නා වූ පරිසරයකට මුහුණ දීම සඳහා උපකාරී වීම පිණිස මෙම පාඨමාලා හදුන්වා දී ඇත. රාජ්‍ය පරිපාලනය පිළිබඳ විෂය භාර අමාත්‍යවරයාගේ පූර්ණ අධීක්ෂණය යටතේ ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ පාලක සභාව විසින් එහි ප්‍රතිපත්ති සම්බන්ධව තීරණය කිරීමේ වගකීම දරනු ලබයි.

ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය, ලන්ඩන්හි සිවිල් සේවා කොලීජිය, සිංගප්පූරුවේ සිවිල් සේවා කොලීජිය, චීනයේ බීජිංහි විදේශ අධ්‍යයන විශ්වවිද්‍යාලය, ඉන්දියාවේ ලාල් බහදූර් ශාස්ත්‍රී ජාතික පරිපාලන ඇකඩමිය, ඔස්ට්‍රේලියාවේ මොනාෂ් විශ්වවිද්‍යාලය, මාලදිවයිනේ සිවිල් සේවා පුහුණු ආයතනය, චීනයේ විද්‍යාව හා තාක්ෂණය පිළිබඳ හුවාසොං විශ්වවිද්‍යාලය වැනි පුහුණු සහ පර්යේෂණ කටයුතු සඳහා පහසුකම් සලසනු ලබන විදේශ විශ්වවිද්‍යාල හා පුහුණු ආයතන කිහිපයක්ම සමඟ ජාලගත වී ඇත. ද්වීපාර්ශ්වික පුහුණු හා පර්යේෂණ සහයෝගිතාව වර්ධනය කරගැනීම සඳහා ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය විසින් පහත සඳහන් ආයතන සමග 2018 වර්ෂයේදී අවබෝධතා ගිවිසුම්වලට එළඹ ඇත.

- පාකිස්තානු ඉස්ලාමීය ජනරජයේ රාජ්‍ය ප්‍රතිපත්ති සඳහා වන ජාතික පාසල
- ඉන්දියාවේ හයිද්‍රාබාද්හි රාජ්‍ය ව්‍යවසාය පිළිබඳ ආයතනය

පසුගිය වසර 38 පුරා දැනුම හා කුසලතා වර්ධනය කිරීම, සංවිධානශීලීත්වය වර්ධනය කිරීම සහ පර්යේෂණ පැවැත්වීම යනාදී සේවාවන් ඉටුකරමින් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය ශක්තිමත් ආයතනයක් ලෙස වර්ධනය වී ඇත

දැක්ම

ආසියාවේ රාජ්‍ය අංශවල ඉගෙනුම හා සංවර්ධනය පිළිබඳ විශිෂ්ටම මධ්‍යස්ථානය බවට පත් වීම.

මෙහෙවර

ඉගෙනුම, සංවර්ධනය, උපදේශන සේවා සහ පර්යේෂණ මඟින් නිර්මාණාත්මකවූත් අති නවීනවූත් පුරවැසි කේන්ද්‍රයවූත් රාජ්‍ය සේවයක් සඳහා අවශ්‍ය වන අඛණ්ඩ වැඩිදියුණු කිරීම් සඳහා පහසුකම් සැලසීම.

උපායමාර්ගික ඉලක්ක

- වඩාත් ජවසම්පන්න සහ කාර්යක්ෂම රාජ්‍ය සේවයක් නිර්මාණය කිරීමෙහිලා වන ජාතික සංවර්ධන ඉලක්කයට දායක වීම.
- ජාතික මට්ටමේ ප්‍රතිපත්ති සංවර්ධනයට දායක වීමේ දී ප්‍රමුඛ කාර්යභාරයක් ඉටු කිරීම.
- ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ ඉගෙනුම් හා සංවර්ධන වැඩසටහන් සඳහා ඉහළ ඉල්ලුමක් ඇති වන පරිදි පාර්ශ්වකරුවන් තුළ ආයතනය කෙරෙහි ධනාත්මක ප්‍රතිරූපයක් ඇති කිරීම.
- ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය දකුණු හා අග්නිදිග ආසියාවේ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ සංවර්ධනය සඳහා වන සහයෝගිතා මධ්‍යස්ථානයක් බවට පරිවර්තනය කිරීම.

ප්‍රධාන කාර්යයන්

- ඉගෙනුම් හා සංවර්ධන වැඩසටහන් තුළින් රාජ්‍ය අංශයේ කළමනාකරණ කාර්ය මණ්ඩලයේ ධාරිතා සංවර්ධනය.
- පශ්චාත් උපාධි වැඩසටහන් තුළින් රාජ්‍ය අංශයේ නිලධාරීන්ගේ දැනුම වර්ධනය කිරීම.
- රාජ්‍ය ප්‍රතිපත්ති හා කළමනාකරණයට අදාළ කාර්ය සාපලායය අරමුණු කරගත් පර්යේෂණ අධ්‍යයන කෝෂ්ඨාගාරයක් සංවර්ධනය කිරීම.
- රාජ්‍ය අංශයේ ආයතනවල සහ රාජ්‍ය හිමිකාරිත්වය දරන ව්‍යාපාරවල ඵලදායිතාව සහ කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම සඳහා ආයතනික සංවර්ධන වැඩසටහන් පැවැත්වීම.
- රාජ්‍ය අංශය සඳහා කාර්යක්ෂමතා කඩඉම් සහ භාෂා ප්‍රවීනතා විභාග පැවැත්වීම.





"කොවිඩ් වසංගතය මධ්‍යයේ වුවද ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය සිය හරිත උයනේ ඖෂධ පැළ සිටුවීමේ වැඩසටහන දියත් කිරීම ද සමාජය හා පරිසර කෙරෙහි ඉටු කළයුතු තම යුතුකම කිසිවිටෙක අමතක කර නැති බව ප්‍රකට කළ අවස්ථාවක් ලෙස මම දකිමි."

රාජ්‍ය සේවා, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම් සහ ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ පාලක සභාවේ සභාපතිතුමාගේ පණිවිඩය

2020 වර්ෂය සඳහා ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ වාර්ෂික වාර්තාවට මෙම කෙටි පණිවිඩය ඉදිරිපත් කිරීමට ලැබීම ගැන මම බොහෝ සෙයින් සතුටු වෙමි. දැඩි පීඩාකාරී කොවිඩ් 19 වසංගතය හේතුවෙන් රටේ සියලුම අංශ මුහුණ දුන් අභියෝගවලට මෙම වසර තුළ ද අබණ්ඩව මුහුණ දීමට සිදුව ඇත.

රාජ්‍ය අංශයේ නිලධාරීන්ගේ ධාරිතා සංවර්ධනය, කළමනාකරණ උපදේශනය, පර්යේෂණ හා සංවර්ධන ඇතුළු රාජ්‍ය සේවා නිලධාරීන් පුහුණු කිරීම හා සංවර්ධනය කිරීම යන අංශ කෙරෙහි ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ ප්‍රධාන අවධානය යොමු වී ඇත. ඉහත අභියෝග හේතුවෙන් මෙම වැඩසටහනේ වේගය යම් පසුබෑමකට ලක්ව ඇති බවක් පෙනේ.

කෙසේ වෙතත්, ඉහත අභියෝග මධ්‍යයේ වුවද මෙම කාල සීමාව තුළ ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයට යම් සාධනීය ප්‍රතිඵල ලබා ගැනීමට හැකිවීම ගැන මම සතුටු වෙමි. ඒ අනුව ආරම්භ කරන ලද වැඩසටහන් දහහතර (14) අතුරින් එක් (01) සේවාරම්භක පුහුණු පාඨමාලාවක්, අනිවාර්ය පුහුණු පාඨමාලා පහක්(05), අභ්‍යන්තර හා බාහිර විභාග දහහතරක් (14) සහ මාර්ගගත ආකාරයෙන් පවත්වන ලද තවත් වැඩසටහන් කිහිපයක් පැවැත්වීමට ආයතනයට හැකි විය.

තවද, කොවිඩ් -19 තත්ත්වය සැලකිල්ලට ගෙන, දිවයින පුරා රාජකාරී කටයුතුවල නිරතව සිටින රාජ්‍ය අංශයේ නිලධාරීන්ට සහාය වීම සඳහා ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය විසින් මාර්ගගත පුහුණු සහ ක්‍රියාකාරකම් ක්‍රමවේදයක් ආරම්භ කර තිබීම මම බෙහෙවින් අගය කිරීමට කැමැත්තෙමි. එසේම රටේ සමාජ හා ආර්ථික සංවර්ධනයට සහාය වීම සඳහා රාජ්‍ය සේවකයින්හට දැනුම ලබා දීම පිණිස ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය විසින් දේශන ගණනාවක් ද සංවිධානය කරන ලදී.

කොවිඩ් වසංගතය මධ්‍යයේ වුවද ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය සිය හරිත උයනේ ඖෂධ පැළ සිටුවීමේ වැඩසටහන දියත් කිරීම ද සමාජය හා පරිසර කෙරෙහි ඉටු කළයුතු තම යුතුකම කිසිවිටෙක අමතක කර නැති බව ප්‍රකට කළ අවස්ථාවක් ලෙස මම දකිමි. මේ සා විශාල කාර්ය භාරයක් ආයතනය විසින් ඉටු කරනු ලබන්නේ පුරප්පාඩු හැට දෙකක් (62) පමණ ඇති සීමිත කාර්ය මණ්ඩලයක දායකත්වයෙන් බවද විශේෂයෙන් සඳහන් කළ යුතුය.

ඉහත අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ලබා දුන් වටිනා මඟ පෙන්වීම් සහ උපදෙස් පිළිබඳව ගරු අමාත්‍යතුමාට සහ ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ පාලක මණ්ඩලයේ සාමාජිකයින්ට ස්තූති කිරීමට මම මෙය අවස්ථාවක් කර ගනිමි. ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ සියලුම කාර්ය මණ්ඩලයට මාගේ සුභාශිංශන පිරිනමමි.

ජේ.ජේ. රත්නසිරි
ලේකම්
රාජ්‍ය සේවා, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය

"මේ වන විට ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ විභාග අංශය ඔස්සේ රාජ්‍ය හා අර්ධ රාජ්‍ය ආයතනයන්හි තෝරා ගත් විභාග පැවැත්වීම පිණිස අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය හිමි වී තිබේ."



ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්තුමියගේ පණිවිඩය

21වන සියවසේ දෙවන දශකයේ සමාප්තිය සමඟ ගෝලීය වශයෙන් මුහුණ දෙන්නට සිදු වූ වසංගත අර්බුදය මධ්‍යයේ ගෙවී ගිය 2020 වසරට අදාළ වන ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ වාර්ෂික වාර්තාවට මෙම පණිවුඩය එක් කිරීමට ලැබුණු අවස්ථාව අතිශයින් අගය කරමි.

කිසිවෙකුගේ පාලනයෙන් බැහැරව පැවති ප්‍රායෝගික දුෂ්කරතා රාශියක් මධ්‍යයේ සියලු පුරවැසියන් හා එක්ව මුහුණ දෙන්නට සිදු වූ අභියෝග අතර කොවිඩ් 19 වසංගතය ශ්‍රී ලංකාවේ මානව සම්පත් සංවර්ධනයේදී එල්ල කළ අභියෝග අතිශයින් තිරණාත්මක විය.

ඉහත කී තත්ව යටතේ වුවද නවක නිලධාරීන් සඳහා සේවාරම්භක පුහුණු වැඩසටහනක් මෙන්ම දීප ව්‍යාප්ත සේවාවන් සඳහා අනිවාර්ය ධාරිතා සංවර්ධන වැඩසටහන් ගණනාවක් ද සම්පූර්ණ කරන්නට මෙම වසරේදී අපට හැකියාව සැලසුණි. මීට අතිරේකව ඩිප්ලෝමා වැඩසටහන් පහක්ද ක්‍රියාත්මක කිරීමට අප වෙත පැවරී තිබුණි. මෙතෙක් රාජ්‍ය ආයතන වල ඉල්ලීම් වලට ප්‍රතිචාර වශයෙන් ඉලක්කගත පුහුණු වැඩසටහන් ඔස්සේ 411 දෙනෙකු පුහුණු කරවන්නද අප ආයතනයට මෙම වසරේදී අවස්ථාව සැලසුණි.

මේ වන විට ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ විභාග අංශය ඔස්සේ රාජ්‍ය හා අර්ධ රාජ්‍ය ආයතනයන්හි තෝරා ගත් විභාග පැවැත්වීම පිණිස අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය හිමි වී තිබේ. කළමනාකරණ උපදේශනය සහ පශ්චාත් උපාධි අධ්‍යයනය ඔස්සේ රාජ්‍ය සේවය තුළ ධාරිතා සංවර්ධනය සඳහා උපරිම දායකත්වයක් ලබා දීමට අපට අවස්ථාව සැලසුණි. අපගේ භාෂා අධ්‍යයන මධ්‍යස්ථානය නිළධාරීන් 200කට වැඩි සංඛ්‍යාවක් සඳහා ඉංග්‍රීසි භාෂා පාඨමාලා පවත්වා තිබේ. ශ්‍රී ලංකාවේ රාජ්‍ය සේවය තුළ පුහුණු අවශ්‍යතා සම්පූර්ණ කිරීම පිණිස මාර්ගගත ක්‍රමය ප්‍රථම වරට භාවිතා කරන ලද්දේ ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය විසිනි. අභියෝගය අවස්ථාවක් කර ගනිමින් අප ආයතනයේ පශ්චාත් උපාධි පාඨමාලාවන් සඳහා මෙම වර්ෂයට අදාල අධ්‍යයන කටයුතු සියල්ල අවරණය කරනු ලැබුවේද මෙම යාන්ත්‍රණය ඔස්සේය.

රාජ්‍ය සේවාවේ පුහුණු වැඩසටහන් නව මංපෙතකට යොමු කිරීම පිණිස ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය දැරූ සියලු ප්‍රයත්නයන් සතුටින් සිහි කළ හැකි අතර අපගේ සාර්ථකත්වය ලගා කරගත හැකි වූයේ සේවයට කැප වූ අප කාර්ය මණ්ඩලයේ සහයෝගය, කැපවීම සමඟ කණ්ඩායම් හැසිරීම් නිසා බව විශ්වාස කරමි.

මේ සියලු ජයග්‍රහණයන් අත්පත් කර ගැනීම පිණිස ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයට නිසි මඟ පෙන්වූ සහ නොමසුරු දිරිය ලබා දුන් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ පාලක සභාවටද අපේ ආයතනය වෙනුවෙන් මගේ කෘතඥතාවය උදක්ම ඵල කර සිටිමි.

ආචාර්ය පී.ජී.ඩී. ප්‍රදීපා සේරසිංහ
අධ්‍යක්ෂ ජනරාල්
ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය





වියුහය ...

විෂය පිළිබඳ විශේෂඥතාවයන්ගෙන් යුත් විශේෂඥයන් මධ්‍යස්ථාන වලට වෙන් කර ඇති අතර එක් එක් මධ්‍යස්ථාන ප්‍රධානියෙකු යටතේ පුහුණු වැඩසටහන්, කළමනාකරණ උපදේශන හෝ පර්යේෂණ අධ්‍යයනයන් සිදු කෙරේ. අවශ්‍ය කරන කාර්යයන් ඉටු කිරීම සඳහා අදාළ විශේෂඥයන් ඒ ඒ මධ්‍යස්ථාන වලින් තෝරාගනු ලබයි. මීට අමතරව වෘත්තීය නිපුණතාවයන් සහ විෂයයන් පිළිබඳ විශේෂඥයන් ලෙස බාහිර සම්පත්දායකයින්ගේ සේවාවන් ද ලබා ගනී.

2. මූල්‍ය තොරතුරු

ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය
2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය

	සටහන්	2020 රු.ශත	2019 රු.ශත
වත්කම්			
ජංගම වත්කම්			
බැංකු ශේෂ	03	24,462,465.87	22,918,072.02
මාස3 තැන්පතු	04	320,652,293.25	302,291,319.34
ලැබීම්	05	46,843,764.05	22,058,329.11
පවත්නා තොග	06	5,537,033.28	5,861,336.98
පූර්ව ගෙවීම්	07	4,059,589.00	3,480,761.33
අත්තිකාරම්	08	69,802.00	293,340.64
කාර්ය මණ්ඩල ණය	09	14,151,150.57	16,059,835.13
		415,776,098.02	**372,962,994.55**
ජංගම නොවන වත්කම්			
දේපළ,යන්ත්‍ර සහ උපකරණ	10	439,323,810.99	421,105,571.58
කෙරෙමින් පවතින ව්‍යාපෘති (ප්‍රාග්ධන)		-	1,644,343.69
පාරිතෝෂික අරමුදල් ආයෝජනය	11	40,776,844.34	38,081,659.54
තැන්පතු ගිණුම්	12	1,299,500.00	1,299,500.00
		481,400,155.33	**462,131,074.81**
මුළු වත්කම්		**897,176,253.35**	**835,094,069.36**
බැරකම්			
ජංගම බැරකම්			
ගෙවිය යුතු තැන්පතු	13	20,441,324.41	21,812,011.68
අත්තිකාරම් ලැබීම්	14	106,561,290.03	105,846,522.47
උපචිත වියදම්	15	4,480,123.73	3,115,638.71
අවිනිශ්චිත ලැබීම් සඳහා ප්‍රතිපාදන		7,532,692.96	4,322,607.91
		139,015,431.13	**135,096,780.77**
ජංගම නොවන බැරකම්			
දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානය	16	19,860,707.06	21,515,765.39
පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන	17	34,741,715.00	32,939,816.50
		54,602,422.06	**54,455,581.89**
මුළු බැරකම්		**193,617,853.19**	**189,552,362.66**
ශුද්ධ වත්කම්		**703,558,400.16**	**645,541,706.70**
ශුද්ධ වත්කම්/සම කොටස්			
විලම්බිත ආදායම -භාණ්ඩාගාර ප්‍රතිපාදන		544,802,377.59	564,544,388.88
වෙනත් සංචිත-වත්කම් ප්‍රතිප්‍රමාණ සංචිත	18	58,615,807.00	12,015,807.00
සමුච්චිත අතිරික්තය / හිඟය	19	100,140,215.57	68,981,510.82
මුළු ශුද්ධ වත්කම්/සම කොටස්		**703,558,400.16**	**645,541,706.70**

ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය
2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂයේ මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශය

	සටහන්	2020 රු.ශත	2019 රු.ශත
ආදායම			
භාණ්ඩාගාරයෙන් ලද මුදල්	20	137,642,011.29	168,977,849.95
වෙනත් ආදායම			
පාඨමාලා ගාස්තු	21	500.00	155,740.00
ශාලා කුලියට දීමෙන්		14,759,696.02	21,975,030.00
ප්‍රකාශන අලෙවි කිරීම		57,190.00	98,932.00
ආයෝජන මගින් ලැබූ ආදායම	22	23,512,978.80	31,718,528.53
ණය පොලී		545,298.98	664,924.88
බදු කුලී	23	7,971,788.51	13,658,393.83
කල්බදු කුලි		1,655,058.33	1,655,058.33
පශ්චාත් උපාධි අධ්‍යයන ආයතනය		18,712,003.71	9,945,276.58
භාෂා වැඩසටහන්		3,562,360.00	1,162,445.75
උපදේශන වැඩසටහන්	24	14,032,754.44	51,648,093.20
ආයතනික කොටස් ආදායම		8,436,678.45	10,356,757.41
විවිධ ආදායම්	25	11,504,728.53	16,113,053.31
මුළු ආදායම		**242,393,047.06**	**328,130,083.77**
වියදම්			
පුද්ගල පඩිනඩි	26	112,686,048.16	108,954,116.89
කාර්ය මණ්ඩල සුභසාධනය	27	3,317,128.95	4,136,515.72
ප්‍රවාහන සහ යැපීම් දීමනා	28	356,566.10	1,099,719.02
උපයෝගිතා සහ වෙනත් සේවා	29	27,817,214.60	34,919,536.08
ප්‍රවාහන	30	3,633,601.56	3,132,607.90
අලුත් වැඩියා සහ ස්ථාවර වත්කම් නඩත්තු කිරීම	31	3,968,285.00	4,480,273.43
සැපයුම් සහ අවශ්‍යතා	32	3,716,961.23	9,178,130.49
මුදල් ගාස්තු	33	743,353.00	3,191,853.99
පුස්තකාල සේවා	34	306,332.50	344,093.50
පුහුණු සහ ඇගයීම්	35	72,160.00	1,181,402.21
ප්‍රකාශන සහ තොරතුරු සේවා	36	-	316,800.00
විදේශ පුහුණු සහ අධ්‍යයන චාරිකා	36-A	-	32,007,008.68
ක්ෂයවීම්	37	36,891,534.85	37,245,423.64
පශ්චාත් උපාධි අධ්‍යයන ආයතනය	38	6,578,888.05	8,961,528.54
ඉංග්‍රීසි වැඩසටහන්	39	1,349,310.00	2,386,103.58
උපදේශන	40	14,032,754.44	51,648,093.20
පාරිතෝෂික ගෙවීම්		6,411,337.00	4,475,874.30
අවිනිශ්චිත ලැබීම් සඳහා ප්‍රතිපාදන		3,210,085.05	653,305.83
මුළු වියදම්		**225,091,560.49**	**308,312,387.00**
කාල සීමාව සඳහා අතිරික්ත/(හිඟ)		**17,301,486.57**	**19,817,696.77**

ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය
2020 දෙසැම්බර් 31 න් අවසන් වන වර්ෂය සඳහා මුදල් ප්‍රවාහය පිළිබඳ ප්‍රකාශය

මෙහෙයුම් ක්‍රියාකාරකම් මගින් මුදල් ප්‍රවාහය	2020 රු. ශත	2019 රු. ශත
වර්ෂය සඳහා ශුද්ධ අතිරික්ත/හිඟ අරමුදල් සංචලනයට බලනොපාන අයිතම සඳහා ගැළපුම	**17,301,486.57**	**19,817,696.77**
ක්ෂය වීම	36,891,534.85	37,245,423.64
ක්‍රමක්ෂය	(27,942,011.29)	(30,687,849.95)
පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන	6,411,337.00	4,475,874.30
අවිනිශ්චිත ලැබීම් සඳහා ප්‍රතිපාදන	3,210,085.05	653,305.83
පෙර වසරේ සැසඳීම්		
මෝටර් වාහන ප්‍රතිතක්සේරුකරණ බලපෑම	14,797,347.24	(2,917,891.53)
	(9,211,381.47)	0.00
කාරක ප්‍රාග්ධනය වෙනස් වීමට පෙර මෙහෙයුම් අතිරික්තය(හිඟය)	**41,458,397.95**	**28,586,559.06**
තොග අඩුවීම් (වැඩිවීම්)	324,303.70	(1,343,050.50)
අත්තිකාරම්වල අඩුවීම් (වැඩිවීම්)	223,538.64	1,647,632.92
පෙර ගෙවීම් වල අඩුවීම් (වැඩිවීම්)	(578,827.67)	50,858.90
කාර්ය මණ්ඩල ණය අඩුවීම් (වැඩිවීම්)	1,908,684.56	(626,895.30)
ලැබීම්වල අඩුවීම් (වැඩිවීම්)	(24,785,434.94)	7,878,765.01
ගෙවියයුතු තැන්පතු වල වැඩිවීම් (අඩුවීම්)	(1,370,687.27)	(27,619,569.16)
උපචිත වියදම් වල වැඩිවීම් (අඩුවීම්)	1,364,485.52	(22,315,963.24)
කෙරෙමින් පවතින ව්‍යාපෘතිවල වැඩිවීම් (අඩුවීම්)	1,644,343.69	(1,644,343.69)
උපදේශන සේවා වල වැඩිවීම් (අඩුවීම්)	714,767.56	12,160,293.96
ගෙවන ලද පාරිතෝෂික	(4,609,438.50)	(1,150,386.00)
මෙහෙයුම් කටයුතුවලින් ලැබෙන ශුද්ධ මුදල් ප්‍රවාහ	**(25,164,264.71)**	**(32,962,657.10)**
ආයෝජන කටයුතුවලින් ලැබෙන මුදල් ප්‍රවාහ		
ගොඩනැගිලි අත්පත් කරගැනීම	(4,507,809.24)	(12,587,715.08)
ගෘහ භාණ්ඩ හා සවිකරණවල අඩුවීම	742,255.36	(3,577,769.79)
කාර්යාලීය උපකරණවල අඩුවීම	638,263.52	(2,854,481.65)
විදුලි උපාංගවල අඩුවීම	2,827,221.60	(4,425,536.40)
පරිගණක ලබාගැනීම	(184,450.00)	(2,810,489.80)
පොත්පත් ලබාගැනීම	(125,009.95)	(712,063.30)
අනෙකුත් වත්කම්වල අඩු වීම	371,006.86	(1,224,498.54)
පාරිතෝෂික අරමුදල් ආයෝජනය	(2,695,184.80)	(3,305,382.91)
කෙටිකාලීන තැන්පතු	(18,360,973.91)	(12,121,011.81)
ආයෝජන කටයුතු වලින් ලැබෙන ශුද්ධ මුදල් ප්‍රවාහ	**(21,294,680.56)**	**(43,618,949.28)**
මූල්‍ය කටයුතු වලින් ලැබෙන මුදල් ප්‍රවාහ		
රජයේ ප්‍රතිපාදන - මූලධනය	8,200,000.00	0.00
DLC Ltd හි වැඩිවීම්(අඩුවීම්)	(1,655,058.83)	(1,655,058.83)
මූල්‍ය කටයුතුවලින් ලැබෙන ශුද්ධ මුදල් ප්‍රවාහ	**6,544,941.17**	**(1,655,058.83)**
මුදල් හා මුදල් සමතුල්‍යතාවල ශුද්ධ වැඩිවීම / (අඩුවීම්)	1,544,393.85	(49,650,106.15)
කාල සීමාව ආරම්භයේ මුදල් හා මුදල් සමතුල්‍යතා	22,918,072.02	72,568,178.17
කාල සීමාව අවසානයේ මුදල් හා මුදල් සමතුල්‍යතා	**24,462,465.87**	**22,918,072.02**

ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය
2019 සහ 2020 දෙසැම්බර් 31 වන දින අවසන් වූ වසර සඳහා ශුද්ධ වත්කම් / ස්කන්ධ වෙනස්කම් පිළිබඳ ප්‍රකාශය

	පාලන ආයතනයේ හිමිකරුවන්ට අදාළ වන			මුළු ශුද්ධ වත්කම්/ ස්කන්ධ
	දායක ප්‍රාග්ධනය	වෙනත් සංචිත	සමුච්චිත අතිරික්ත/(හිඟ)	
	රු.ශත	රු.ශත	රු.ශත	රු.ශත
2019 ජනවාරි 01 දිනට ශේෂය	595,232,238.83	12,015,807.00	52,081,705.58	659,329,751.41
ගිණුම්කරණ ප්‍රතිපත්තියේ වෙනස් වීම				
ගිණුම්කරණ ප්‍රතිපත්තියේ වෙනස් වීම			(2,917,891.53)	(2,917,891.53)
ප්‍රතිප්‍රකාශිත ශේෂය	595,232,238.83	12,015,807.00	49,163,814.05	656,411,859.88
පෙර වසර හා ගැළපුම්				
භාණ්ඩාගාරයෙන් ලැබෙන මුදල් - මූලධනය				
විලම්බිත ආදායම ක්‍රමක්ෂය	(30,687,849.95)			(30,687,849.95)
කාල සීමාව සඳහා අතිරික්ත/හිඟ			19,817,696.77	19,817,696.77
2019 දෙසැම්බර් 31 ට ඉදිරියට ගෙනා ශේෂය	564,544,388.88	12,015,807.00	68,981,510.82	645,541,706.70
2020 ජනවාරි 01 ට ශේෂය	564,544,388.88	12,015,807.00	68,981,510.82	645,541,706.70
ස්ථාවර වත්කම් ප්‍රතිප්‍රමාණය කිරීම		46,600,000.00		46,600,000.00
ගිණුම්කරණ ප්‍රතිපත්තියේ වෙනස් වීම				
ගිණුම්කරණ ප්‍රතිපත්තියේ වෙනස් වීම				-
පෙර වසර හා ගැළපුම්			13,857,218.18	13,857,218.18
ප්‍රතිප්‍රකාශිත ශේෂය 2020 වර්ෂය සඳහා ශුද්ධ වත්කම් / ස්කන්ධවල වෙනස	564,544,388.88	58,615,807.00	82,838,729.00	705,998,924.88
භාණ්ඩාගාරයෙන් ලැබෙන මුදල් - මූලධනය	8,200,000.00			8,200,000.00
විලම්බිත ආදායම ක්‍රමක්ෂය	(27,942,011.29)			(27,942,011.29)
කාල සීමාව සඳහා අතිරික්ත/හිඟ			17,301,486.57	17,301,486.57
2020 දෙසැම්බර් 31 ට ඉදිරියට ගෙනා ශේෂය	544,802,377.59	58,615,807.00	100,140,215.57	703,558,400.16





පශ්චාත් උපාධි අධ්‍යාපන පාසල

උපාධි ලබා දීමේ ක්‍රමවත් වැඩ පිළිවෙලක් පිහිටුවීමේ පියවරක් වශයෙන් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය (SLIDA) විසින් පශ්චාත් උපාධි අධ්‍යාපන පාසල ස්ථාපනය කර තිබේ. ආයතනය සතුව අධ්‍යයන ව්‍යාපෘති කණ්ඩායම් සහ අධ්‍යයන කටයුතු විධායක මණ්ඩලයක් පවතී. මෙම දෙපිරිස සතුව කළමනාකරණ පශ්චාත් උපාධි පාඨමාලා හදාරන්නන් තෝරා ගැනීම ට, පාඨමාලා අන්තර්ගතය තීරණය කිරීම ට, ප්‍රතිඵල නිකුත් කිරීම ට සහ විනය ක්‍රියා මාර්ග අනුගමනය කිරීමට අවශ්‍ය නෛතික බලය පවතී.

පශ්චාත් උපාධි අධ්‍යාපන ආයතනය රාජ්‍ය කළමනාකරණ සහ පර්යේෂණ අධ්‍යයන්හි ව්‍යවහාරික මධ්‍යස්ථානය වේ. විවිධත්වය සපිරි පාරිභෝගික පිරිසකට උසස් තත්ත්වයේ අධ්‍යයන සහ වෘත්තීයමය සංවර්ධන පාඨමාලා හඳුන්වා දීම සඳහා මෙම ආයතනය බැඳී සිටි යි. පශ්චාත් උපාධි පාඨමාලා රාජ්‍ය, පුද්ගලික සහ රාජ්‍ය නොවන අංශ සියල්ලක්ම සඳහා විවෘත ව පවතී. පාඨමාලා අන්තර්ගතයේ අරමුණ පාඨමාලාව හදාරන්නන් දැනුමින් සන්නද්ධ කර සාර්ථක වෘත්තීයමය කළමනාකරුවන් ලෙස ගොඩ නැංවීම යි. මෙම ආයතනයේ පශ්චාත් උපාධි පාඨමාලාවන් මගින් තොරතුරු තාක්ෂණ කුසලතා සහ අනෙකුත් විශේෂඥතා සපුරාගැනීම තුළින් වෘත්තීයමය අරමුණු සාක්ෂාත් කර ගැනීමේ අවස්ථාව පාඨමාලාව හදාරන්නන් වෙත උදා කර දී තිබේ.

3. පාලක සභාවේ සාමාජිකයින්

1982 අංක 9 ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතන පනතේ 6 (1) වගන්තිය ප්‍රකාරව, රාජ්‍ය පරිපාලන ගරු අමාත්‍යවරයා විසින් 2020 වර්ෂය සඳහා පාලක සභාවේ සාමාජිකයින් වශයෙන් පහත සඳහන් පුද්ගලයෝ පත් කරනු ලැබූහ.

ජේ.ජේ.රත්නසිරි මහතා - **සභාපති**
ලේකම්
රාජ්‍ය සේවා, පළාත් සභා සහ පළාත් පාලන
අමාත්‍යාංශය

ගාමිණී එස්. සෙනරත් මහතා - **සාමාජික**
අග්‍රාමාත්‍ය ලේකම්
අග්‍රාමාත්‍ය කාර්යාලය

එස්.ආර්.ආටිගල මහතා - **සාමාජික**
ලේකම්, මුදල්, ආර්ථික හා ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශය

මහාචාර්ය. කේ.කපිල.සී.කේ පෙරේරා - **සාමාජික**
ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය

සුමිත් අබේසිංහ මහතා - **සාමාජික**

කෞෂාල් මෙන්ඩිස් මහතා - **සාමාජික**

ආර්.පී පණ්ඩිත කෝරළගේ මහතා - **සාමාජික**

පී.අල්ගම මහතා - **සාමාජික**

ගෝඨාභය ජයරත්න මහතා - **සාමාජික**

කේ.බී.වී.ඩී.එන් මුතුගල මහතා - **සාමාජික**

පී.එස්.පී. අබේවර්ධන මහතා - **සාමාජික**

පී.පී.ඩී. ප්‍රදීපා සේරසිංහ මහත්මිය - **සාමාජික**
SLIDA හි (වැඩබලන) අධ්‍යක්ෂ ජනරාල්

4. ජ්‍යෂ්ඨ කළමනාකරණය හා අධ්‍යනේන්ද්‍රීය

4.1 අධ්‍යක්ෂ මණ්ඩලය පිළිබඳ කෙටි සටහන

කේ.එම්.එස්.ඩී. ජයසේකර මහත්මිය
අධ්‍යක්ෂ ජනරාල් (වැඩබලන) (2020.01.01 සිට 2020.08.25 දක්වා)
අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (ඉගෙනුම් හා සංවර්ධන)
ශ්‍රී ලංකා පරිපාලන සේවය (SLAS) - විශේෂ ශ්‍රේණිය
රාජ්‍ය පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය, පශ්චාත් උපාධි කළමනාකරණ ආයතනය, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය, ශ්‍රී ලංකාව
උපාය මාර්ගික මානව සම්පත් කළමනාකරණය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය, ඕස්ට්‍රේලියාවේ වික්ටෝරියා විශ්ව විද්‍යාලය
කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව, ශ්‍රී ලංකා පශ්චාත් උපාධි කළමනාකරණ ආයතනය
විද්‍යාවේදී උපාධිය (ජීව විද්‍යාව), ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය, ශ්‍රී ලංකාව.

ජී.ජී.ඩී. ප්‍රදීපා සේරසිංහ මහත්මිය
අධ්‍යක්ෂ ජනරාල් (වැඩ බලන) (2020.08.25 සිට 2020.12.31 දක්වා)
ශ්‍රී ලංකා පරිපාලන සේවය (SLAS) - විශේෂ ශ්‍රේණිය
ව්‍යාපාර කළමණාකරණය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය (MBA) - රාජ්‍ය ප්‍රතිපත්ති පිළිබඳ විද්‍යායතනය - බර්මින්හැම් විශ්ව විද්‍යාලය - එක්සත් රාජධානිය,
ශාස්ත්‍රවේදී උපාධිය (ගෞරව) - ජන සන්නිවේදනය සහ සිංහල, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය,
සත්ව විද්‍යාව, උද්භිද රසායන විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධිය
යහපාලනය සහ ආචාරධර්ම, රාජ්‍ය අංශයේ සාරධර්ම හා ප්‍රමිති පිළිබඳ විශේෂ ඇල්ම
උරුම කළමනාකරණය පිළිබඳ ප්‍රවීනත්වය
ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශයේ අධ්‍යක්ෂ, ශ්‍රී ලංකා ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ ලේකම් හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ අතිරේක ලේකම් ලෙස සේවා අත්දැකීම්
වර්තමානයේ රාජ්‍ය සේවා, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (රාජ්‍ය පරිපාලන).

ජේ.එස්.ප්‍රසාද් පියසේන මහතා
අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පරිපාලන හා මූල්‍ය)
ශ්‍රී ලංකා පරිපාලන සේවය SLAS - විශේෂ ශ්‍රේණිය
සමාජ විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය, කැළණිය විශ්ව විද්‍යාලය.
ලේඛකත්ව හා සන්නිවේදනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය
ව්‍යවහාරික විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධිය, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය

නෙරංජලා ජේ. ජයසුන්දර මහත්මිය
අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (ආයතනික සංවර්ධන)
පාරිසරික ආර්ථික විද්‍යාව පිළිබඳ විද්‍යාපති උපාධිය, කෘෂිකර්මය පිළිබඳ පශ්චාත් උපාධි ආයතනය, පේරාදෙණිය විශ්ව විද්‍යාලය,
කෘෂිකර්මය පිළිබඳ විද්‍යාවේදී උපාධිය (ගෞරව), පේරාදෙණිය විශ්ව විද්‍යාලය,
පරිසර කළමනාකරණය පිළිබඳ වෘත්තීය සහතිකය Carl Duiseberg Geselshaft (CDG) ,ජර්මනිය
පුහුණු ක්‍රමවේදයන් පිළිබඳ සිංගප්පූරු සිවිල් සේවා විද්‍යාලයේ සහතිකලත් ප්‍රධාන පුහුණුකරු
එක්සත් ජනපද වන සංරක්ෂණ සේවය විසින් සහතික කරන ලද ආපදා කළමනාකරණයේ හදිසි අවස්ථා විධාන පිළිබඳ ජාතික පුහුණුකරු.

ඩබ්ලිව්.එම්.එම්.ජී.ඩී. විජේකෝන් මහතා
අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පර්යේෂණ හා සංවර්ධන / කළමනාකරණ නොවන පුහුණුව)
විද්‍යාපති උපාධිය (නාගරික පරිසර කළමනාකරණය), AIT - තායිලන්තය.
ශාස්ත්‍රවේදී (ගෞරව) උපාධිය (භූගෝල විද්‍යාව), කොළඹ විශ්ව විද්‍යාලය.

ආචාර්ය එස්.ආර්.එස්.එන්. සුදසිංහ මහත්මිය
අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (වැඩ බලන) (පශ්චාත් උපාධි අධ්‍යයන ආයතනය)
සංවර්ධන පරිපාලනය පිළිබඳ ආචාර්ය උපාධිය (රාජ්‍ය ප්‍රතිපත්ති කළමනාකරණය පිළිබඳ විශේෂඥ)
ශාස්ත්‍රපති උපාධිය (ආර්ථික විද්‍යාව) කොළඹ විශ්ව විද්‍යාලය
ආර්ථික සංවර්ධනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව (කොළඹ විශ්ව විද්‍යාලය)
ශාස්ත්‍රවේදී උපාධිය (ගෞරව) ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය

4.2 ජ්‍යෙෂ්ඨ අධ්‍යයන උපදේශකවරු

ජී.කේ.ඩී. අමරවර්ධන මහතා
ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ ජ්‍යෙෂ්ඨ අධ්‍යයන උපදේශක
හිටපු අමාත්‍යාංශ ලේකම්
ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ හිටපු ජ්‍යෙෂ්ඨ උපදේශක
රාජ්‍ය ප්‍රතිපත්ති පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය සිංගප්පූරු ජාතික විශ්ව විද්‍යාලය, සිංගප්පූරුව
පරිගණක තාක්ෂණය, තොරතුරු සන්නිවේදන තාක්ෂණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව, කොළඹ විශ්ව විද්‍යාලය
භෞතික විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී (ගෞරව) උපාධිය - පේරාදෙණිය විශ්ව විද්‍යාලය

රාජේන්ද්‍රකුමාර් ගනේශරාජා මහතා
ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ ජ්‍යෙෂ්ඨ අධ්‍යයන උපදේශක
සහකාර දේශ අධ්‍යක්ෂ, සමාජ අන්තර්කරණය හා සවිබල ගැන්වීම සඳහා වූ රාජ්‍ය පාලනය, චික්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන
ප්‍රධානී - පාලන, ප්‍රතිපත්ති හා පර්යේෂණ - ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය
ප්‍රධානී - නිපුණතා වැඩි දියුණු කිරීම සහ භාෂා - ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය
ප්‍රධානී - තොරතුරු හා ප්‍රලේඛන - ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය
රාජ්‍ය ප්‍රතිපත්ති හා පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය(පළමු පන්තිය),
විද්‍යාවේදී උද්හිද විද්‍යා විශේෂ උපාධිය (පළමු පන්තියේ ගෞරව).

සීතා සී. විතානාරච්චි මිය
ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ ජ්‍යෙෂ්ඨ අධ්‍යයන උපදේශක
පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශයේ විශ්‍රාමික ලේකම්
ජාතික භාෂා අධ්‍යාපන හා පුහුණු ආයතනයේ හිටපු සභාපතිනිය
ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාවේ හිටපු මහලේකම්
මිනිස්බල අධ්‍යයනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව
කාන්තාවන් සඳහා කළමනාකරණ සංවර්ධනය පිළිබඳ පශ්චාත් උපාධි සහතිකපත්‍ර පාඨමාලාව
රාජ්‍ය කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව
භූගෝල විද්‍යාව පිළිබඳ විශේෂ උපාධිය 2 වන පන්තියේ (ගෞරව)

4.3 අභ්‍යන්තර පීඨය

ඒ. ලොකුගමගේ මහතා
ජ්‍යෙෂ්ඨ උපදේශක
ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය (I ශ්‍රේණිය)
ශාස්ත්‍රපති(මූල්‍ය ආර්ථික) කොළඹ විශ්ව විද්‍යාලය, පශ්චාත් උපාධි ඩිප්ලෝමා (ආර්ථික සංවර්ධනය)
පශ්චාත් උපාධි ඩිප්ලෝමා (සමායතන හා ක්‍රමෝපායික මූල්‍ය)
HNDA, DPFM, DIPPCA, Dip in IT, MAAT

නීතීඥ ආර්.දිසානායක මහත්මිය
ජ්‍යෙෂ්ඨ උපදේශක (2020.01.01 සිට 2020.01.14)
ශ්‍රී ලංකා පරිපාලන සේවය (I ශ්‍රේණිය)
දිවුරුම් කොමසාරිස්
ව්‍යාපෘති කළමණාකරනපති උපාධිය
ජාත්‍යන්තර සබඳතා පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව
වික්ටෝරියා, ශ්‍රී ලංකාවේ විවෘත විශ්ව විද්‍යාලය
විද්‍යාවේදී (ගෞරව) උපාධිය කැළණිය විශ්ව විද්‍යාලය
DIPPCA

තනුක්ෂා අබේවර්ධන මෙනවිය
ජ්‍යෙෂ්ඨ උපදේශක
ශ්‍රී ලංකා පරිපාලන සේවය (I ශ්‍රේණිය)
ජාත්‍යන්තර සම්බන්ධතා පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය, ICU, ටෝකියෝ, ජපානය
ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය, පේරාදෙණිය විශ්ව විද්‍යාලය
පාරිසරික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය, පේරාදෙණිය විශ්ව විද්‍යාලය
ඊ-පාලනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව, අයි.පී.එම්, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය
සත්ව විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී (විශේෂ) උපාධිය, පේරාදෙණිය විශ්ව විද්‍යාලය
රාජ්‍ය පරිපාලනය පිළිබඳ ඩිප්ලෝමාව, ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය

කේ.ආර් ගංගාධාර මහතා
ජ්‍යෙෂ්ඨ උපදේශක (2020.01.01 සිට 2020.01.06)
ශ්‍රී ලංකා පරිපාලන සේවය (I ශ්‍රේණිය)
ජාත්‍යන්තර හා සංවර්ධන ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය (ANU, ඕස්ට්‍රේලියාව)
ජාත්‍යන්තර හා සංවර්ධන ආර්ථික විද්‍යාව පිළිබඳ උපාධි ඩිප්ලෝමාව (ANU, ඕස්ට්‍රේලියාව)
භූගෝල විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී විශේෂ උපාධිය පේරාදෙණිය විශ්ව විද්‍යාලය
රාජ්‍ය පරිපාලනය පිළිබඳ ඩිප්ලෝමාව (ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය)

එම්.එස් අනුරුද්ධ මහතා
ජ්‍යෙෂ්ඨ උපදේශක
ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය SLAcS (1 ශ්‍රේණිය)
ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය (MBA) රජරට විශ්ව විද්‍යාලය
ශාස්ත්‍රපති උපාධිය (ආර්ථික විද්‍යාව), කැළණිය විශ්ව විද්‍යාලය
වරලත් රාජ්‍ය මූල්‍ය ගණකාධිකාරී (ශ්‍රී ලංකාව)
වරලත් රාජ්‍ය මූල්‍ය ගණකාධිකාරී (ලන්ඩන්)
ජාත්‍යන්තර සබඳතා පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව (BCIS)
අලෙවි කළමණාකරණය පිළිබඳ විද්‍යාවේදී විශේෂ උපාධිය
රාජ්‍ය පරිපාලනය පිළිබඳ DIPPCA ඩිප්ලෝමාව

එස්.ඩී.එන්.යූ සේනාධීර මහතා
ජ්‍යෙෂ්ඨ උපදේශක/ප්‍රධානී/භාෂා අධ්‍යයන මධ්‍යස්ථානය
ශ්‍රී ලංකා පරිපාලන සේවය (විශේෂ ශ්‍රේණිය)
රාජ්‍ය පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය, ඕස්ට්‍රේලියාවේ ෆ්ලින්ඩර්ස් විශ්ව විද්‍යාලය
වාග් විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය - කැළණිය විශ්ව විද්‍යාලය
ශාස්ත්‍රවේදී උපාධිය - පේරාදෙණිය විශ්ව විද්‍යාලය

කේ.ප්‍රසන්න චන්දිත්
ජ්‍යෙෂ්ඨ උපදේශක
ශ්‍රී ලංකා පරිපාලන සේවය (විශේෂ ශ්‍රේණිය)
ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය රජරට විශ්ව විද්‍යාලය

විද්‍යාවේදී උපාධිය,පේරාදෙණිය විශ්ව විද්‍යාලය.
තිරසාර සංවර්ධනය පිළිබඳ අධ්‍යාපන ඩිප්ලෝමාව, ස්වීඩනයේ උප්සලා විශ්ව විද්‍යාලය.
රාජ්‍ය කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාව, ස්වීඩනය
සහතිකලත් මානව සම්පත් විගණක
Associate Professional Green Building Council

ශාන්ත වීරසිංහ මහතා
ජ්‍යෙෂ්ඨ උපදේශක
ශ්‍රී ලංකා පරිපාලන සේවය (විශේෂ ශ්‍රේණිය)
ඊ - රාජ්‍යය පිළිබඳ රාජ්‍ය පරිපාලනය ශාස්ත්‍රපති උපාධිය (PIM-ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය),
ආයතනික කළමනාකරණය ශාස්ත්‍රපති උපාධිය (පේරාදෙණිය විශ්ව විද්‍යාලය),
අධ්‍යාපනවේදී පශ්චාත් උපාධි ඩිප්ලෝමාව (කොළඹ විශ්ව විද්‍යාලය),
ඊ-රාජ්‍යය පිළබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව (PIM-ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය),
විද්‍යාවේදී උපාධිය, කැළණිය විශ්ව විද්‍යාලය,
රාජ්‍ය පරිපාලනය පිළිබඳ ඩිප්ලෝමාව, ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය
ගුරු පුහුණු සහතිකය (ජාතික අධ්‍යාපන ආයතනය NIE),
ප්‍රාදේශීය පරිපාලනය, රාජ්‍ය පරිපාලනය, මානව සම්පත් කළමනාකරණය සහ ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ පළපුරුද්ද.

එන්.එම්.එස්.ඒ බණ්ඩාර මහතා
උපදේශක
තොරතුරු තාක්ෂණය පිළිබඳ විද්‍යාපති උපාධිය, මොරටුව විශ්ව විද්‍යාලය
විද්‍යාපති උපාධිය (වන විද්‍යා) ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය
විද්‍යාවේදී උපාධිය, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය,

හෂිණි ජයසේකර මෙනවිය
උපදේශක
සහකාර අධ්‍යක්ෂ (විභාග) (2020.02.05 සිට 2020.12.31 වන කාල සීමාව තුළ රාජකාරී ආවරණය කිරීම වෙනුවෙන්)
ශ්‍රී ලංකා පරිපාලන සේවය (II ශ්‍රේණිය)
ශාස්ත්‍රපති උපාධිය (සමාජ විද්‍යාව), කැළණිය විශ්ව විද්‍යාලය
නීතිවේදී උපාධිය, විවෘත විශ්ව විද්‍යාලය
ශාස්ත්‍රවේදී කලා (ගෞරව) උපාධිය, කොළඹ විශ්ව විද්‍යාලය

එල්.සී.එම් පෙරේරා මහතා
සහකාර උපදේශක
නාගරික විද්‍යා ශාස්ත්‍රපති උපාධිය, කොරියාවේ සෝල් විශ්ව විද්‍යාලය
කෘතිම බුද්ධිය පිළිබඳ විද්‍යාවේදී උපාධිය (AI), මොරටුව විශ්ව විද්‍යාලය,
කොළඹ විශ්ව විද්‍යාලයේ තොරතුරු තාක්ෂණවේදී උපාධිය.

4.4 සේවා පහසුකම් සලසන්නන් පිළිබඳ කෙටි සටහන

ආර්.ඒ.එස්.පී. රණවීර මහත්මිය
ලේඛකාධිකාරී
පශ්චාත් උපාධි ඩිප්ලෝමා (ගණිතය) - ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය
විද්‍යාවේදී (ගෞරව)උපාධිය, පේරාදෙණිය විශ්ව විද්‍යාලය

ඩී.එස්. පත්මසිරි මහතා
අධ්‍යක්ෂ(මුදල්)
ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය (I ශ්‍රේණිය)
විද්‍යාවේදී විශේෂ උපාධිය(රාජ්‍ය පරිපාලනය), ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය.
ව්‍යාපාර අධ්‍යයනය පිළිබඳ ඩිප්ලෝමාව, වරලත් බලපත්‍රලාභී ආයතනය, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනය

වයි. අනිරුත්තනන් මහතා
අධ්‍යක්ෂ(පාලන)
ශ්‍රී ලංකා පරිපාලන සේවය (I ශ්‍රේණිය)
සංවර්ධන අධ්‍යයන පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය, කොළඹ විශ්ව විද්‍යාලය
මහජන ප්‍රතිපත්ති පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය, ඕස්ට්‍රේලියාවේ RMIT විශ්ව විද්‍යාලය
විද්‍යාවේදී (ගෞරව) විශේෂ උපාධිය (රසායන විද්‍යාව), යාපනය විශ්ව විද්‍යාලය

ටී.ඩී. නාරංගොඩ මහත්මිය
අභ්‍යන්තර විගණක
BBMtg. මානව සම්පත් (විශේෂවේදී) උපාධිය, කැළණිය විශ්වවිද්‍යාලය
ශාස්ත්‍රපති උපාධිය (ආර්ථික විද්‍යාව) කැළණිය විශ්වවිද්‍යාලය
වරලත් රාජ්‍ය මූල්‍ය ගණකාධිකාරී සාමාජික(වරලත් ගණකාධිකාරී ආයතනය, ශ්‍රී ලංකාව)
ව්‍යාපාර හා මූල්‍ය පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය
රාජ්‍ය ප්‍රසම්පාදනය හා කොන්ත්‍රාත් පරිපාලනය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමාව,ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය

බී.ඒ. ප්‍රියානි බාලසූරිය මහත්මිය
පුස්තකාලයාධිපති
වරලත් පුස්තකාලයාධිපති, ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ ආශ්‍රිත සාමාජික.
කැළණිය විශ්ව විද්‍යාලයේ පුස්තකාල හා තොරතුරු විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය.
අධ්‍යාපනවේදී පශ්චාත් උපාධි ඩිප්ලෝමාව, පේරාදෙණිය විශ්ව විද්‍යාලය.
ශාස්ත්‍රවේදී උපාධිය,කැළණිය විශ්ව විද්‍යාලය.
පුස්තකාල විද්‍යා ඩිප්ලෝමාව, ශ්‍රී ලංකා පුස්තකාල සංගමය.
කළමනාකරණ ඩිප්ලෝමාව, ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය.

එස්.එල්.අයි. සමරවික්‍රම මහත්මිය
සහකාර ලේඛකාධිකාරී
ශාස්ත්‍රපති උපාධිය (ආර්ථික විද්‍යාව), කැළණිය විශ්ව විද්‍යාලය
විද්‍යාවේදී උපාධිය මානව සම්පත් කළමනාකරණය (විශේෂ), ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය





පුහුණු සහ අධ්‍යයන කටයුතු

පුහුණු සහ අධ්‍යයන කටයුතු අංශයේ මූලික කාර්යය වන්නේ උසස් තත්ත්වයේ රාජ්‍ය සේවයක් ජාතිය වෙත සැලසීම සඳහා රාජ්‍ය කළමනාකරණ සේවයේ නියුතු සියලුම ශ්‍රේණි වල නිලධාරීන් වෙත ඔවුන්ගේ දැනුම සහ කුසලතා සංවර්ධනය කිරීමයි. එහි පුහුණු කටයුතු වලට අමතරව, රාජ්‍ය සේවයේ කාර්යක්ෂමතාව ඉහළ නැංවීමේ අරමුණින් ව්‍යාපෘති අංශය මගින් පුහුණු සහ කළමනාකරණ උපදේශන සේවාවන් ද සැපයෙනු ලැබේ.

ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය (SLIDA) වසර 50කට අධික කාලයක් මුළුල්ලේ ශ්‍රී ලංකාවේ සංවර්ධනයට සහ රාජ්‍ය සේවයේ මානව සම්පත හැකියාවන් ගෙන් සන්නද්ධ කිරීමට කාර්යක්ෂම සහ ඵලදායී අයුරින් දායක වෙමින් එහි වගකීම් ඉටු කරමින් සිටියි.

5. ක්‍රියාකාරිත්වය හා ආයතනික ව්‍යුහය

5.1 ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ ක්‍රියාකාරී ව්‍යුහය



5.2 SLIDA හි සංවිධානාත්මක ව්‍යුහය



06. අධ්‍යක්ෂ ජනරාල්ගේ සමාලෝචනය

ඉගෙනුම් හා සංවර්ධන වැඩසටහන් - 2020

ඉගෙනුම් හා සංවර්ධන අංශය යනු ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයෙහි (SLIDA) හි සියලු ඉගෙනුම් හා සංවර්ධන ක්‍රියාකාරකම් සමඟ කටයුතු කරන කේන්ද්‍රීය ආයතනයයි. එය රාජ්‍ය අංශයේ නිලධාරීන්ගේ ධාරිතා සංවර්ධන අවශ්‍යතා සපුරාලීම සඳහා ඉගෙනුම් හා සංවර්ධන සේවා අවශ්‍යතා සපයයි. මෙම අරමුණු සඳහා, රාජ්‍ය අංශයේ වෙනස්වන නිපුණතා වැඩි දියුණු කිරීමේ අවශ්‍යතා සමඟ වේගයෙන් කටයුතු කිරීමට හැකි වන පරිදි ව්‍යුහයක් මෙම අංශයට ඇතුළත් කර ඇත.

ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය විසින් රාජ්‍ය අංශයේ ආයතන සහ ඔවුන්ගේ කළමනාකරණ සේවකයින්ගේ නිපුණතා ගොඩනැගීම සඳහා පහත සඳහන් ක්‍රියාකාරකම් සිදු කරයි.

1. අදාළ සේවා ව්‍යවස්ථාවලට අනුකූලව පහත සඳහන් දීප ව්‍යාප්ත සේවාවන්හි නව බඳවා ගැනීම් සඳහා සේවාරම්භක පුහුණුව. (ගාස්තු අය නොකරන වැඩසටහන්)
   i. ශ්‍රී ලංකා පරිපාලන සේවය (SLAS),
   ii. ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය (SLAcS),
   iii. ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවය (SLPS),
   iv. ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවය (SLSS)
   v. ශ්‍රී ලංකා වාස්තු විද්‍යා සේවා (SLArS)
   vi. ශ්‍රී ලංකා ඉංජිනේරු සේවය (SLES)
   vii. ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවය (SLICTS)

2. සියලුම දීප ව්‍යාප්ත සේවා නිලධාරීන්ගේ I ශ්‍රේණියේ සහ III ශ්‍රේණියේ මට්ටම්වල අනිවාර්ය ධාරිතා වර්ධන වැඩසටහන් (ගාස්තු අය නොකෙරෙන වැඩසටහන්)

3. ඩිප්ලෝමා වැඩසටහන් (ගාස්තු අයකරන)

4. කෙටි කාලීන පුහුණු වැඩසටහන් (ගාස්තු අය නොකෙරෙන වැඩසටහන්)

5. ඉල්ලුම් ප්‍රකාරව සම්පාදිත පුහුණු වැඩසටහන් - රාජ්‍ය අංශයේ ආයතන සහ රාජ්‍ය ව්‍යවසායන් විසින් කරන ලද ඉල්ලීම් මත පදනම්ව (ගාස්තු අය කිරීමේ වැඩසටහන්)

6. කළමනාකරණ උපදේශන (ගාස්තු අය කරන)

7. වෙනත් පාඨමාලා (ගාස්තු අයකරන සහ ගාස්තු අය නොකරන වැඩසටහන්)

6.1. සේවාරම්භක පුහුණු වැඩසටහන්

දීප ව්‍යාප්ත සේවයට අලුතින් බඳවා ගන්නා අය සඳහා වන පුහුණු වැඩසටහන් ඔවුන් වෙත පුළුල් පරාසයක විෂය කරුණු ඉදිරිපත් කිරීමට සහ සිය සේවාවන්හි පෙර ගමන්කරුවන් ලෙස කටයුතු කිරීමට අවශ්‍ය දැනුම, කුසලතා සහ ආකල්පවලින් ඔවුන් සන්නද්ධ කිරීම උදෙසා පවත්වනු ලබයි. ප්‍රධාන විෂය කරුණු පිළිබඳ මොඩියුලවලට අමතරව, ඌව කුඩාඔය කමාන්ඩෝ රෙජිමේන්තු පුහුණු පාසලේ සහභාගීත්වයෙන් බාහිර පුහුණුවීම් සිදුකිරීම හා පුද්ගල හා පුද්ගල පෞරුෂ සංවර්ධනය සඳහා විශේෂ වැඩසටහන් ද ඇතුළත් කර ඇත. තවද, SLIDA හි භාෂා මධ්‍යස්ථානය ඔවුන්ගේ සේවාරම්භක පුහුණුවේදී භාෂා පුහුණු වැඩසටහන් පවත්වා ඇත. ඇතැම් වැඩසටහන් රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව සමඟ එක්ව සංවිධානය කරන ලදී.

සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ කෝවිඩ් -19 වසංගතය හේතුවෙන් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය විසින් නිලධාරීන් 71 දෙනෙකු සඳහා සේවාරම්භක පුහුණු වැඩසටහන් 02 ක් පමණක් පවත්වා ඇති අතර, ඒ පිළිබඳ විස්තර පහත දැක්වේ.

අනු අංක	සේවාව	සහභාගී වූ පිරිස	ප්‍රගතිය
01	ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ (SLICT) සේවයේ II පංතියේ II ශ්‍රේණිය සඳහා සේවාරම්භක පුහුණු වැඩසටහන්	36	අවසන් කර ඇත
02	ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවය	35	අවසන් කර ඇත
	මුළු ගණන	71	

6.2. දීප ව්‍යාප්ත සේවාවන් සඳහා අනිවාර්ය ඉගෙනුම් සහ සංවර්ධන වැඩසටහන්

දීප ව්‍යාප්ත සේවාවල නිලධාරීන්ගේ වෘත්තීය සංවර්ධනය සඳහා අවශ්‍ය දැනුම, කුසලතා සහ ආකල්ප අඛණ්ඩව සංවර්ධනය කිරීම සිය මූලික වගකීමක් ලෙස ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය (SLIDA) හඳුනාගෙන තිබේ.

දීප ව්‍යාප්ත සේවා වල සේවා ව්‍යවස්ථාවලට අනුව, මෙම සේවාවන්හි නිලධාරීන්ට සේවාරම්භක පුහුණුව සහ ධාරිතා සංවර්ධන වැඩසටහන් සම්පූර්ණ කිරීම අනිවාර්ය අවශ්‍යතාවයකි.

එබැවින්, කාර්යක්ෂම හා ඵලදායී රාජ්‍ය සේවාවක් සහතික කිරීම සඳහා මෙම නිලධාරීන් අතර අඛණ්ඩ ඉගෙනුම් සංස්කෘතියක් නිර්මාණය කිරීම අතිශයින් වැදගත් ය. ඒ අනුව, පහත සඳහන් සංකල්ප මත පදනම්ව දීප ව්‍යාප්ත සේවා නිලධාරීන් සඳහා පමණක් මෙම වැඩසටහන් පවත්වනු ලබයි:

- වරින් වර අවශ්‍ය විය හැකි විශේෂයෙන් හඳුනාගත් චර්යාත්මක හා තාක්ෂණික නිපුණතා වැඩිදියුණු කිරීම.
- සීඝ්‍රයෙන් වෙනස් වන පරිසරයක දිනෙන් දින ඉහළ යන අභියෝගයන්ට සාර්ථකව මුහුණ දීම සඳහා අවශ්‍ය දැනුම හා කුසලතා අඛණ්ඩව යාවත්කාලීන කිරීම හා වැඩිදියුණු කිරීම.

ඒ අනුව, ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය (SLIDA) විසින් ශ්‍රී ලංකා පරිපාලන සේවයේ (SLAS) සහ ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ නිලධාරීන් 596 සඳහා 2020 වර්ෂය තුළ සේවා නියුක්තික ධාරිතා සංවර්ධන වැඩසටහන් කිහිපයක් පවත්වා ඇති අතර, ඒවායේ තොරතුරු පහත දක්වා ඇත.

	සේවය	**වැඩසටහන් සංඛ්‍යාව**	**සහභාගී වූ සංඛ්‍යාව**	**ප්‍රගතිය**
1	ශ්‍රී ලං ප පා සේ I ශ්‍රේණිය	2	80	ක්‍රියාත්මක වෙමින් පවතින
2	ශ්‍රී ලං ග සේ III ශ්‍රේණිය	3	128	ක්‍රියාත්මක වෙමින් පවතින
3	ශ්‍රී ලං ග සේ I ශ්‍රේණිය	4	170	ක්‍රියාත්මක වෙමින් පවතින
4	ශ්‍රී ලං ග සේ III ශ්‍රේණිය	5	218	• වැඩසටහන් 3 - අවසන් කර ඇත • වැඩසටහන් 2 - ක්‍රියාත්මක වෙමින් පවතී
	මුළු ගණන		**596**	

6.3. නිපුණතා සංවර්ධන වැඩසටහන - ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවය සහ ශ්‍රී ලංකා වාස්තු විද්‍යාත්මක සේවය I, II සහ III ශ්‍රේණි

කළමනාකරණ නිපුණතා සංවර්ධන වැඩසටහන ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවය, වාස්තු විද්‍යාත්මක සේවය සහ ශ්‍රී ලංකා තාක්ෂණික සේවය යන සේවයන්හි (I, II සහ III ශ්‍රේණි) නිලධාරීන් සඳහා සැලසුම් කර ඇති අතර මෙම වැඩසටහනේ අරමුණ වන්නේ සේවාවන් සම්බන්ධයෙන් දැනුම හා කුසලතා වැඩි දියුණු කිරීම සහ වඩා හොඳ සේවාවක් සඳහා ධනාත්මක ආකල්ප වර්ධනය කිරීමයි. (ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවය / වාස්තු විද්‍යාත්මක සේවය / තාක්ෂණික සේවය).

මෙම වැඩසටහන මඟින් සහභාගිවන්නන්ට සේවයේ වෘත්තිකයෙකු ලෙස කළමනාකරණ හා තාක්ෂණික අංශ

දෙකටම නිරාවරණය වීමෙන් ඔවුන්ගේ වෘත්තීය නිපුණතාව සහ වෘත්තීය සංවර්ධනය වැඩි දියුණු කිරීමට අවස්ථාවක් ලබා දේ. මෙම වැඩසටහන 2019 සහ 2020 යන වසර දෙකෙහිම පැවැත්වීමට සැලසුම් කර තිබූ අතර සහභාගී වූවන්ගේ මුළු සංඛ්‍යාව 441 කි. 2020 වර්ෂය තුළ පහත සඳහන් කණ්ඩායම් දෙකම මෙම වැඩසටහන්වලට සහභාගී වී ඇත.

අනු අංක	කණ්ඩායම	තත්‍ය සහභාගී වූ පිරිස	ප්‍රගතිය
1	1 කණ්ඩායම	34	ක්‍රියාත්මක වෙමින් පවතින
2	2 කණ්ඩායම	29	ක්‍රියාත්මක වෙමින් පවතින

6.4. ඩිප්ලෝමා වැඩසටහන්

ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය (SLIDA) රාජ්‍ය ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත් පරිපාලනය පිළිබඳ (DIPPCA) සහ (HNDIPPCA), තොරතුරු තාක්ෂණය (DIT), කාර්යාල කළමනාකරණය (DOM), ගබඩා කළමනාකරණය (DSM) සහ වෘත්තිකයන් සඳහා ඉංග්‍රීසි යන ක්ෂේත්‍ර සඳහා ඩිප්ලෝමා වැඩසටහන් සහ පරිපාලන නීතිය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව (DEP) පවත්වනු ලබයි. මෙම ඩිප්ලෝමා ඉතා ජනප්‍රිය වන අතර රාජ්‍ය අංශයේ කාර්යසාධනය වර්ධනය කිරීම සඳහා ඉතා වටිනා දායකත්වයක් ලබා දී ඇත.
පහත සඳහන් ඩිප්ලෝමා වැඩසටහන් 2020 දී පවත්වා ඇත.

අනු අංක	වැඩසටහනේ නම	සහභාගී වූ ප්‍රමාණය	ප්‍රගතිය
1	රාජ්‍ය ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත් පරිපාලනය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමාව - 2020/2021 (WE)	40	දැනට ක්‍රියාත්මක
02	රාජ්‍ය ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත් පරිපාලනය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමාව - 2020/2021 (TU)	55	දැනට ක්‍රියාත්මක
03	රාජ්‍ය ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත් පරිපාලනය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමාව - 2020/2021 (TH)	35	දැනට ක්‍රියාත්මක
04	කාර්යාල කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාව	40	දැනට ක්‍රියාත්මක
05	පරිපාලන නීතිය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව	38	දැනට ක්‍රියාත්මක
	මුළු	208	

6.5. ඉල්ලුම් ප්‍රකාරව සම්පාදිත ඉගෙනුම් සහ සංවර්ධන වැඩසටහන්

සේවාදායක ආයතන විසින් කරන ලද ඉල්ලීම්වලට සරිලන පරිදි මෙම වැඩසටහන් විශේෂයෙන් නිර්මාණය කර ඇත. 2020 දී ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය විසින් පුහුණු වැඩසටහන් 15 ක් පවත්වා ඇති අතර රාජ්‍ය අංශයේ ආයතනවල ඉල්ලීම පරිදි නිලධාරීන් 594 දෙනෙකු පුහුණු කර ඇත. පහත සඳහන් ඉල්ලුම් ප්‍රකාරව සම්පාදිත වැඩසටහන් 2020 දී පවත්වා ඇත.

අනු අංක	සේවාදායක ආයතනය	ඉල්ලුම් ප්‍රකාරව සම්පාදිත පුහුණු ක්ෂේත්‍රය	සහභාගී වූ සංඛ්‍යාව
1	අධ්‍යාපන අමාත්‍යාංශය	මාණ්ඩලික නිලධාරීන් සඳහා ධාරිතා සංවර්ධනය පිළිබඳ ඉල්ලුම් ප්‍රකාරව සම්පාදිත පුහුණු වැඩසටහන්	37
2	අධ්‍යාපන අමාත්‍යාංශය	මාණ්ඩලික නිලධාරීන් සඳහා ධාරිතා සංවර්ධනය පිළිබඳ ඉල්ලුම් ප්‍රකාරව සම්පාදිත පුහුණු වැඩසටහන්	37
3	ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය	කළමණාකරුවන් සඳහා ධාරිතා සංවර්ධනය පිළිබඳ ඉල්ලුම් ප්‍රකාරව සම්පාදිත සේවාරම්භක පුහුණු වැඩසටහන්	12

4	තල් සංවර්ධන මණ්ඩලය	ධාරිතා සංවර්ධනය පිළිබඳ ඉල්ලුම් ප්‍රකාරව සම්පාදිත පුහුණු වැඩසටහන්	19
5	රාජ්‍ය පරිපාලන,ආපදා කළමණාකරණ සහ පශු සම්පත් සංවර්ධන අමාත්‍යාංශය	රාජ්‍ය අංශයේ මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ඉල්ලුම් ප්‍රකාරව සම්පාදිත පුහුණු වැඩසටහන්	40
6	ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය	වාර්ෂික ක්‍රියාකාරී සැලසුම සකස් කිරීම පිළිබඳ ඉල්ලුම් ප්‍රකාරව සම්පාදිත පුහුණු වැඩසටහන්	59
7	අධ්‍යාපන දෙපාර්තමේන්තුව	තොරතුරු තාක්ෂණ නිලධාරීන් සඳහා ඉල්ලුම් ප්‍රකාරව සම්පාදිත පුහුණු වැඩසටහන්	50
8	ජාතික පොලිස් ඇකඩමිය	නියෝජ්‍ය පොලිස්පති සඳහා කළමනාකරණය සහ සංවර්ධනය පිළිබඳ ඉල්ලුම් ප්‍රකාරව සම්පාදිත පුහුණු වැඩසටහන	10
9	තිරසාර සංවර්ධන සභාව	කාර්යාල කළමනාකරණය සහ රජය පිළිබඳ ඉල්ලුම් ප්‍රකාරව සම්පාදිත සේවාරම්භක පුහුණු වැඩසටහන්	12
10	ජාතික පොලිස් ඇකඩමිය	ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී තනතුරට උසස් කරන ලද නිලධාරීන් සඳහා කළමනාකරණය සහ සංවර්ධනය පිළිබඳ ඉල්ලුම් ප්‍රකාරව සම්පාදිත පුහුණු වැඩසටහන්	29
11	සංගණන දෙපාර්තමේන්තුව	අවශ්‍ය සංඛ්‍යාලේඛකයින් සඳහා සේවාරම්භක පුහුණු වැඩසටහන්	45
12	Huminity & Inclusion Office	Provide tailored Training to LA'S & DS'S	30
13	ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය	ආපදා අවදානම් කළමනාකරණය පිළිබඳ ධාරිතා වර්ධන වැඩසටහන	31
14	රාජ්‍ය පරිපාලන,ආපදා කළමණාකරණ සහ පශු සම්පත් සංවර්ධන අමාත්‍යාංශය	ජාත්‍යන්තර ටෝස්ට් මාස්ටර් සංගමය සමග කථන ශිල්ප පුහුණුව	37
15	අභ්‍යන්තර සහ ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය	පරිපාලන ග්‍රාම නිලධාරී සඳහා සේවාරම්භක පුහුණු වැඩසටහන	146

6.6. කළමනාකරණ උපදේශන

රාජ්‍ය අංශයේ ආයතන සඳහා කළමනාකරණ උපදේශන සැපයීමට ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයෙහි ඉගෙනුම් හා සංවර්ධන අංශය දායක විය. සාමාන්‍යයෙන් මෙම උපදේශන, සේවක සංඛ්‍යාව, ක්‍රියාවලීන්, වැඩ ප්‍රමාණය තක්සේරු කිරීම සහ අත්පොත් සහ මාර්ගෝපදේශ, සංයුක්ත සැලසුම්, ආයතනික සැලසුම්, මානව සම්පත් සංවර්ධන සැලසුම් සහ කාර්ය සාධනය වැඩිදියුණු කිරීමේ උපාය මාර්ගික සැලසුම් යනාදිය සමාලෝචනය කිරීම සඳහා සිදු කරනු ලබයි. පහත සඳහන් ආයතනික සංවර්ධන සේවාවන් 2020 දී ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය විසින් සපයන ලදී.

*රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය සඳහා ඊ-පුරවැසි තොරතුරු පද්ධතිය සකස් කිරීම - UNDP
*දෙහිවල - ගල්කිස්ස මහ නගර සභාව සඳහා (ERP) ඊ ආර් පී පද්ධතිය (පළමු අදියර) ක්‍රියාත්මක කිරීම

07. පශ්චාත් උපාධි අධ්‍යයන පාසල

1985 අංක 7 දරන පනත මඟින් සංශෝධිත 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25 අ වගන්තිය යටතේ වූ නියෝගය ප්‍රකාරව 2003 වර්ෂයේදී විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයට ශාස්ත්‍රපති මට්ටමේ උපාධි ප්‍රදානය කිරීමේ තත්ත්වය පිරිනමා ඇත. ඒ අනුව පශ්චාත් උපාධි අධ්‍යයන ආයතනය පිහිටුවන ලද අතර, පසුව ජාතික හා ප්‍රාදේශීය හා ජාත්‍යන්තර මට්ටමින් රාජ්‍ය අංශයේ වෘත්තිකයන් සමඟ අඛණ්ඩව සම්බන්ධ වී කටයුතු කරන ලදී. මෙම ශාස්ත්‍රපති උපාධි වැඩසටහන පෞද්ගලික අංශයට විවෘත වන අතර සතියේ දිනවල මෙන්ම සති අන්තයේ දිනවල ද පාඨමාලා පැවැත්වෙන බැවින් එය සන්නද්ධ හමුදා, පොලිස් සහ සෞඛ්‍ය අංශයේ සේවකයින් අතර ද වඩාත්ම ඉල්ලුමට ලක් වූ වැඩසටහන බවට පත් වී ඇත. අමාත්‍යාංශ ලේකම්වරුන්,ප්‍රධාන විධායක නිලධාරීන් සහ අනෙකුත් පාර්ශ්ව කරුවන් විසින් සිය කළමණාකරුවන් වෙතින් සුවිශේෂ දායකත්වයක් අපේක්ෂා කරන්නා වූත් වේගයෙන් වෙනස් වන හා අභියෝගාත්මක පරිසරයක් පසුබිම් කොටගෙන මෙම රාජ්‍ය කළමනාකරණපති උපාධි පාඨමාලාව හදුන්වා දී ඇත. මෙම සුවිශේෂ වැඩසටහන මඟින් ශාස්ත්‍රපති උපාධියක් ලබා ගැනීම සඳහා එහි අධ්‍යයන සාමාජිකයින් හට පහසුකම් සලසන අතර විවිධ කළමනාකරණ මට්ටම්වල විශ්වාසයෙන් යුතුව කටයුතු කිරීමට ඔවුන්ට කුසලතා වර්ධනය කරගැනීමේ ලා උපකාරී වේ.

පශ්චාත් උපාධි අධ්‍යයන ආයතනය මඟින් ලබාදෙනු ලබන රාජ්‍ය කළමණාකරණය පිළිබඳ පශ්චාත් උපාධි පාඨමාලාව රටේ ප්‍රමුඛතම ප්‍රායෝගික පශ්චාත් උපාධි පාඨමාලාවන්ගෙන් එකකි. මේ අනුව, පාඨමාලාවට අයදුම්කර ඇති අයගෙන් සුදුස්සන් තෝරා ගැනීමේ ක්‍රියාවලිය, පාඨමාලාවේ අන්තර්ගතය සහ ඉගෙනුම් අත්දැකීම ලබාදෙන විලාසය පිළිබඳ සලකා බැලීමේදී මෙම පාඨමාලාව වෙනත් සමාන පාඨමාලාවලට වඩා වෙනස් වන අතර මෙහි පාඨමාලා ලාභීන්ට විදෙස් රටක සංචාරය කොට තම ක්ෂේත්‍රයට අදාළ ප්‍රායෝගික අත්දැකීම ලබා ගැනීමට කටයුතු සම්පාදනය කර ඇත. මෙහි ප්‍රතිඵලයක් ලෙස පාඨමාලාවට ඇතුළත් වීමට වෘත්තිකයන්ගෙන් ඉහළ ඉල්ලුමක් පවතින අතර එම සංඛ්‍යාව තව දුරටත් වැඩිවෙමින් පවතී.



වගුව 1X:

රාජ්‍ය කළමනාකරණපති (MPM) වැඩසටහන සඳහා මේ දක්වා ලියාපදිංචි වී ඇති සංඛ්‍යාව

2020 වසර ආරම්භයේදී, පශ්චාත් උපාධි අධ්‍යයන ආයතනය විසින් ලියාපදිංචි අපේක්ෂකයින් 89 දෙනෙකු සහිත 2019-2020 කණ්ඩායමට අදාළ පාඨමාලාවේ සමාරම්භක උත්සවය 2020 මාර්තු 03 සංවිධානය කළ අතර 2020 වසර තුළ මෙම පශ්චාත් උපාධි අධ්‍යයන ආයතනය විසින් ලියාපදිංචිකරුවන් 247 දෙනෙකුගෙන් යුත් සමාන්තර කණ්ඩායම් 3 ක් සඳහා පාඨමාලා ක්‍රියාත්මක කර ඇත.

දැනුම එක් රැස් කිරීම, යෙදවීම, සංරක්ෂණය හා බෙදා හැරීම සඳහා පශ්චාත් උපාධි අධ්‍යයන ආයතනය විසින් කාලීන වශයෙන් වැදගත් වන මාතෘකා පිළිබඳව රාජ්‍ය අංශයේ සහ පෞද්ගලික අංශයේ පාඨමාලා

ලාභීන් සඳහා සාකච්ඡා සහ ආරාධිත දේශන කිහිපයක් සංවිධානය කරන ලදී. උපාධි ප්‍රදානය කරන ආයතනයක් ලෙස පශ්චාත් උපාධි අධ්‍යයන ආයතනය විසින් රාජ්‍ය අංශය සඳහා සම්මන්ත්‍රණ වැනි විශේෂ වැඩසටහන් පවත්වනු ලබයි.

රාජ්‍ය කළමනාකරණපති උපාධි පාඨමාලාවට සහභාගිවන්නන්ට සහ ඒ සඳහා උනන්දුවක් දක්වන රාජ්‍ය හා පෞද්ගලික අංශයේ පාර්ශ්වයන්ට අදාළ පාඨමාලාව ලබා දීමේ අරමුණින්, ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ පශ්චාත් උපාධි අධ්‍යයන ආයතනය විසින් ශ්‍රී ලංකාවේ රාජ්‍ය හා පෞද්ගලික අංශයේ විධායක නිලධාරීන්ගේ කළමනාකරණ ධාරිතාව ඉහළ නැංවීම පිණිස දේශීය හා ගෝලීය වශයෙන් අදාළ වන වැදගත් මාතෘකා පිළිබඳ ප්‍රසිද්ධ දේශන ද සංවිධානය කරනු ලබයි.

ජැමෙයිකාවේ තාක්ෂණ විශ්වවිද්‍යාලයේ නීති පීඨයේ පීඨාධිපති ආචාර්ය ප්‍රතිභා මහානාමහේවා මහතා විසින් 2020 ජනවාරි 16 වන දින ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේදී "පරිපාලනමය තීරණ ගැනීම: මානව අයිතිවාසිකම් සහ මූලික අයිතිවාසිකම්" යන මාතෘකාව යටතේ ප්‍රසිද්ධ දේශනයක් පවත්වන ලද අතර ඒ සඳහා විශාල පිරිසක් සහභාගී විය.

සණස සංවර්ධන බැංකුවේ (SDB) ප්‍රධාන විධායක නිලධාරි තිලක් පියදිගම මහතා 2020 පෙබරවාරි 13 වන දින ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේදී "පුද්ගලික අංශයේ මනා පරිචයෙන් රාජ්‍ය අංශයට ලද හැකි ආදර්ශය" යන මාතෘකාව යටතේ ප්‍රසිද්ධ දේශනයක් පැවැත් වූ අතර එයට විශාල පිරිසක් සහභාගී විය.

2020 පෙබරවාරි 27 වන දින කොළඹ විශ්ව විද්‍යාලයේ ආර්ථික අධ්‍යයනාංශයේ ආර්ථික විද්‍යාව පිළිබඳ මහාචාර්ය ඩී.ඒ.සී. සිල්වා මහතා විසින්ද "සංවර්ධන හා ප්‍රතිපත්ති සැලසුම් කිරීමේ ආර්ථික අංශ" පිළිබඳ දේශනයක් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේදී පවත්වන ලදී.

ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේදී අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (වැඩබලන) (ප.උ.අ.ආ) ආචාර්ය එස්.ආර්.එස්.එන්. සුදසිංහ මහත්මිය 2020 මැයි මස 06 වන දින "කොවිඩ් -19 වසංගත කාල සීමාව තුළ රාජ්‍ය අංශයේ කළමනාකරුවන්ගේ කාර්යභාරය" යන මාතෘකාව යටතේ ද 2020 මැයි 15 වන දින" ප්‍රජා සහභාගීත්වය හා සවිබල ගැන්වීම හරහා රෝග සම්ප්‍රේෂණය බිඳ දැමීම" යන මාතෘකාව යටතේ ද වෙබ් සම්මන්ත්‍රණ දෙකක් පවත්වන ලදී.



08. 2020 වසර තුළ පවත්වන ලද විභාග

ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ විභාග අංශය 2020 වසර තුළ විභාග 14 ක් පවත්වන ලද අතර ඉන් විභාග 7 ක් බාහිර ආයතන සඳහා වූ අතර අනෙක් ඒවා අභ්‍යන්තර පාඨමාලාවලට අදාළ විභාග විය.

බාහිර විභාග ලෙස ප්‍රධාන වශයෙන් කාර්යක්ෂමතා කඩඉම් විභාග සහ අභ්‍යන්තර උසස්වීම් විභාග ඇතුළත් වේ. සමාලෝචනයට භාජනය වූ කාල සීමාව තුළ ශ්‍රී ලං. සං. පරිපාලන ආයතනය විසින් පහත සඳහන් බාහිර හා අභ්‍යන්තර විභාග පවත්වනු ලැබ ඇත. ශ්‍රී ලං. සං. පරිපාලන ආයතනයේ තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානයේ සහාය ඇතිව මාර්ගගතව පවත්වන ලද එක් විභාගයක් ද ක් මෙයට ඇතුළත් ය.

2020 වසර තුළ ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය විසින් පවත්වන ලද විභාග

අභ්‍යන්තර විභාග

අනු අංක	දෙපාර්තමේන්තුව	විභාගයේ නම	අපේක්ෂකයින් ගණන
1	ශ්‍රී.ලං.සං.ප. ආයතනය	රාජ්‍ය ප්‍රසම්පාදනය හා කොන්ත්‍රාත් පරිපාලනය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමාව මාර්ගගත පරීක්ෂණය	87
2	ශ්‍රී.ලං.සං.ප. ආයතනය	රාජ්‍ය ප්‍රසම්පාදනය හා කොන්ත්‍රාත් පරිපාලනය පිළිබඳ ඩිප්ලෝමාව 2018/2019 නැවත පරීක්ෂණය	02
3	ශ්‍රී.ලං.සං.ප. ආයතනය	ශ්‍රී ලං. ස. ප ආයතනයේ සහතිකලත් රියදුරන් සඳහා ඩිප්ලෝමා පරීක්ෂණය	12
4	ශ්‍රී.ලං.සං.ප. ආයතනය	ශ්‍රී ලං. ස. ප ආයතනයේ සහතිකලත් කා.කා.ස සඳහා ඩිප්ලෝමා පරීක්ෂණය	04
5	ශ්‍රී.ලං.සං.ප. ආයතනය	ඉංග්‍රීසි පරීක්ෂණය 2019 1 වන කණ්ඩායම II මට්ටම	46
6	ශ්‍රී.ලං.සං.ප. ආයතනය	රාජ්‍ය කළමනාකරණපති (MPM) 2017-2019 අධ්‍යයන වාරය (VI) විභාගය	85
7	ශ්‍රී.ලං.සං.ප. ආයතනය	රාජ්‍ය කළමනාකරණපති (MPM) 2018-2020 අධ්‍යයන වාරය (VI) විභාගය	75

බාහිර විභාග

අනු අංක	දෙපාර්තමේන්තුව	විභාගයේ නම	අපේක්ෂකයින් ගණන
01	රාජ්‍ය පරිපාලන හා කළමණාකරණ අමාත්‍යාංශය	ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ කාර්යක්ෂමතා කඩඉම් විභාගය - III ශ්‍රේණිය 3 පංතිය	224
		ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ කාර්යක්ෂමතා කඩඉම් විභාගය - II ශ්‍රේණිය 3 පංතිය	151
		ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ කාර්යක්ෂමතා කඩඉම් විභාගය - I ශ්‍රේණිය 3 පංතිය	21
		ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ කාර්යක්ෂමතා කඩඉම් විභාගය - II ශ්‍රේණිය 2 පංතිය	56

		ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ කාර්යක්ෂමතා කඩඉම් විභාගය - I ශ්‍රේණිය 2 පංතිය	11
		ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ කාර්යක්ෂමතා කඩඉම් විභාගය - III ශ්‍රේණිය 1 පංතිය	13
		ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ කාර්යක්ෂමතා කඩඉම් විභාගය - II ශ්‍රේණිය 1 පංතිය	2
		ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ කාර්යක්ෂමතා කඩඉම් විභාගය - I ශ්‍රේණිය 1 පංතිය	0
02	රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව	විධායක ශ්‍රේණියේ සහකාර රජයේ මුද්‍රණාලයාධිපති නිලධාරීන් සඳහා වන පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය	2
03	සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව	සිංහල ශබ්දකෝෂ කාර්යාලයේ II ශ්‍රේණියේ නිලධාරීන් සහ සිංහල විශ්වකෝෂ නිලධාරී සඳහා කාර්යක්ෂමතා කඩඉම් විභාගය	7
04	ආරක්ෂක අමාත්‍යාංශය	නීති නිලධාරී සඳහා වන පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය	1
05	උසස් අධ්‍යාපන, තාක්ෂණ සහ නවෝත්පාදන අමාත්‍යාංශය	නීති නිලධාරී සඳහා වන පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය	1
06	වරාය හා නාවික අමාත්‍යාංශය	නීති නිලධාරී සඳහා වන පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය	1
07	රාජ්‍ය පරිපාලන හා කළමණාකරණ අමාත්‍යාංශය	දීප ව්‍යාප්ත සේවාවන්හි නිලධාරීන් සඳහා වන පළමු හා දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාග	994



09. තොරතුරු තාක්ෂණය සඳහා වන මධ්‍යස්ථානය

මෙම මධ්‍යස්ථානයේ පරමාර්ථය වන්නේ පුහුණු හා උපදේශන සේවා තුළින් රාජ්‍ය අංශයේ ආයතනවලට ඔවුන්ගේ තොරතුරු සන්නිවේදන තාක්ෂණ හැකියාවන් වර්ධනය කර ගැනීමට සහාය වීමයි. කොවිඩ් 19 වසංගතය හේතුවෙන්, ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය සිය පුහුණු වැඩසටහන් සේවාරම්භක හා ධාරිතා සංවර්ධන වැඩසටහන් සඳහා පමණක් සීමා කරන ලදී. මෙම වර්ෂය තුළදී අපගේ මධ්‍යස්ථානය විසින් සේවාරම්භක හා ධාරිතා වර්ධන වැඩසටහන් සඳහා මොඩියුල වැඩසටහන් 7 ක් පවත්වන ලදී. මෙම වැඩසටහන් මාර්ගගත තාක්ෂණ ක්‍රමවේද භාවිතයෙන් පවත්වන ලද අතර මාර්ගගත දේශන සැසි පැවැත්වීම සඳහා අපි මයික්‍රොසොෆ්ට් ටීම් (Microsoft Team) මෘදුකාංගය භාවිතා කළෙමු. දේශන බොහොමයක් සෞඛ්‍ය බලධාරීන් විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශ අනුගමනය කරමින් "නිවසේ සිට වැඩ කිරීමේ ක්‍රමවේදය" (WFH) අනුව සිදු කරන ලදී. Microsoft Team මෘදුකාංගය මයික්‍රොසොෆ්ට් සමාගම විසින් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ භාවිතය සඳහා නොමිලේ ලබා දෙන ලදී.

මෙම කාල සීමාව තුළ කළමනාකරණ උපදේශන පැවරුම් හතරක් සහ මෘදුකාංග ආශ්‍රිත ව්‍යාපෘති තුනක් අවසන් කරන ලද අතර ඒවායේ තොරතුරු පහත වගුවල දක්වා ඇත.

2020 ජනවාරි - දෙසැම්බර් කාලය තුළ පවත්වන ලද සේවාරම්භක හා ධාරිතා වර්ධන පුහුණු වැඩසටහන්

අනු අංක	වැඩසටහනේ නම	දින ගණන	ඉලක්කගත වැඩසටහන් ගණන	පවත්වන ලද වැඩසටහන් ගණන	සහභාගී වූ ගණන	ගතවූ දින ගණන
1.	ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ II - ශ්‍රේණිය II - පංතිය සඳහා සේවාරම්භක පුහුණු වැඩසටහන විවෘත සහ සීමිත(කණ්ඩායම 01)	13	03	01	30	390
2.	ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ II - ශ්‍රේණිය II - පංතිය සඳහා සේවාරම්භක පුහුණු වැඩසටහන විවෘත සහ සීමිත (කණ්ඩායම 02)	01	02	01	29	29
3.	උපායමාර්ගික නායකයින් සඳහා ධාරිතා සංවර්ධනය වර්ධන කිරීමේ වැඩසටහන (SLAS 1 ශ්‍රේණියේ නිලධාරීන්) - සී කාණ්ඩය ඊ-රජය පිළිබඳ මොඩියුලය ක්‍රියාත්මකයි	02	01	01	38	76

4.	උපායමාර්ගික නායකයින් සඳහා ධාරිතා සංවර්ධනය වර්ධන කිරීමේ වැඩසටහන (SLAS 1 ශ්‍රේණියේ නිලධාරීන්) - බී කාණ්ඩය ඊ-රජය පිළිබඳ මොඩියුලය ක්‍රියාත්මකයි	02	01	01	32	64
5.	SLAS III ශ්‍රේණි(2012) ය සඳහා ධාරිතා වර්ධනය - ඊ-රාජ්‍ය හා ආරක්ෂාව සහ ඊ-ඉගෙනීම පිළිබඳ මොඩියුලය	05	03	03	135	675
	Total	23	10	7	264	1234

2020 ජනවාරි - දෙසැම්බර් කාලය තුළ මාර්ගගතව පවත්වන ලද විභාග

අනු අංක	විභාග	අපේක්ෂකයින් සංඛ්‍යාව
1.	ශ්‍රී ලං. ප. සේ III 2012 CBP A කණ්ඩායම සඳහා 2020.02.26 දින ඊ-රාජ්‍ය සහ සුරක්ෂිතතාව පිළිබඳ මොඩියුල විභාගය	40
2.	ශ්‍රී ලං. ප. සේ III 2012 CBP C කණ්ඩායම සඳහා 2020.11.19 දින ඊ-රාජ්‍ය සහ සුරක්ෂිතතාව පිළිබඳ මොඩියුල විභාගය	47
3.	ශ්‍රී ලං. ප. සේ III 2012 CBP B කණ්ඩායම සඳහා 2020.11.19 දින ඊ-රාජ්‍ය සහ සුරක්ෂිතතාව පිළිබඳ මොඩියුල විභාගය	44

2020 ජනවාරි - දෙසැම්බර් කාලය තුළ අනෙකුත් රාජ්‍ය ආයතන විසින් තොරතුරු සන්නිවේදන තාක්ෂණ විද්‍යාගාරය කුලියට ලබා ගැනීම

අනු අංකය	වැඩසටහනේ සහ ආයතනයේ නම	දින ගණන	ලැබුණු මුදල රුපියල්වලින්
1.	පාර්ලිමේන්තු මැතිවරණය 2020 - මැතිවරණ කොමිෂන් සභාවේ නිලධාරීන් පුහුණු කිරීම	1	125,000.00
2.	කොළඹ නාගරික මැතිවරණ කාර්යාලය විසින් මැතිවරණ ප්‍රතිඵල වගු පුහුණුව සඳහා පරිගණක පහසුකම් ලබා ගැනීම	1	49,000.00
3.	කොළඹ මහ නගර සභාව විසින් පවත්වනු ලබන පුද්ගලික ලිපි ගොනු පරිගණකගතකරණ වැඩසටහන	1	49,000.00
	මුළු එකතුව		**223,000.00**

2020 දෙසැම්බර් / ජනවාරි කාලසීමාව තුළ භාර ගන්නා ලද කළමනාකරණ උපදේශන වැඩසටහන්

අනු අංක	ආයතනය	මාතෘකාව	කාලසීමාව	වටිනාකම රුපියල්වලින්
1	දෙහිවල - ගල්කිස්ස මහ නගර සභාව	ERP ඊ ආර් පී පද්ධතියේ අධීක්ෂණය හා ඇගයීම - පළමු කොටස	2020 ජනවාරි-දෙසැම්බර්	Rs.317,511.25

2	කොළඹ මහ නගර සභාව	තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ යෙදවුම් හා යටිතල පහසුකම් අධීක්ෂණය හා ඇගයීම	2020 ජුනි-දෙසැම්බර්	Rs. 1,803,378.34
3	කොළඹ මහ නගර සභාව	ප්‍රතිලාභී තොරතුරු කළමනාකරණ පද්ධතිය	2020 මාර්තු-දෙසැම්බර්	Rs. 605,044.44
4	පොහොර ලේකම් කාර්යාලය (කෘෂිකර්ම අමාත්‍යාංශය)	පොහොර කළමනාකරණ දත්ත සමුදාය	2020 සැප්තැම්බර්-දෙසැම්බර්	මුදල් අයවීමක් සිදු නොවන අතර එය නොමිළයේ සිදු කරනු ලබන සේවාවකි

2020 දී ආයතනය තුළ මෘදුකාංග පද්ධති ක්‍රියාත්මක කිරීම

මෘදුකාංගයේ නම

1. මෘදුකාංග හා දෘඩාංග නඩත්තු පද්ධතිය
2. කාර්යක්ෂමතා කඩඉම් විභාග සඳහා මාර්ගගත ප්‍රවේශ සැකසුම් පද්ධතිය
3. ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ විභාග සඳහා බඳවා ගැනීමේ කළමනාකරණ පද්ධතිය

පන්ති කාමර අලුත්වැඩියාව

මෙම කාලය තුළ පරිගණක විද්‍යාගාර 2 සහ 3 අලුත්වැඩියා කිරීම අවසන් කරන ලදී.

දෘඩාංග අලුත්වැඩියා කිරීම

මෙම කාල සීමාව තුළ දෝෂ සහිත NEC ඩෙස්ක්ටොප් යන්ත්‍ර විසිපහක් ශ්‍රී.ලං.සං.ප. ආයතනයේ තාක්ෂණික සහායක (IT) විසින් ශ්‍රී.ලං.සං.ප. ආයතනය වෙත කිසිදු වියදමක් නොමැතිව අලුත්වැඩියා කරන ලදී.



10. භාෂා අධ්‍යයනය සඳහා වන මධ්‍යස්ථානය

භාෂා අධ්‍යයන කේන්ද්‍රය විසින් පහත සඳහන් පරිදි 2020 දී නිලධාරීන් 200 කට වැඩි පිරිසක් සඳහා ඉංග්‍රීසි භාෂා පාඨමාලා පවත්වන ලදී.



මෙම පාඨමාලා මගින් ඔවුන්ගේ සේවා ස්ථානවල වාචිකව හා ලිඛිත සන්නිවේදනයෙන් විශ්වාසයෙන් යුතුව ඉංග්‍රීසි භාවිතා කිරීම සඳහා රාජ්‍ය නිලධාරීන්ගේ ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාවය වර්ධනය කිරීම කෙරෙහි අවධානය යොමු කරන ලදී. කථන ශිල්පීය පුහුණු වැඩසටහන මගින් සහභාගිවන්නන්ගේ පොදු කථන කුසලතා ක්‍රමානුකූලව වර්ධනය කර ගැනීම සඳහා විශේෂයෙන් පුහුණු කරන ලදී. රැකියා සඳහා ඉංග්‍රීසි යන මැයෙන් වන සහතික පත්‍ර පාඨමාලාව සහ ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය මගින් පවත්වනු ලබන ඉංග්‍රීසි ඩිප්ලෝමාව විවිධ සන්දර්භයන් තුළ සන්නිවේදනය සඳහා ඉංග්‍රීසි භාවිතා කිරීමේ සියලුම කුසලතා වැඩි දියුණු කිරීම කෙරෙහි අවධානය යොමු කළේය.



2020 වර්ෂයේ භාෂා අධ්‍යයනය සඳහා වන මධ්‍යස්ථානයේ කාර්ය දර්ශකය

පාඨමාලාවේ නම	මට්ටම	සහභාගී වූ සංඛ්‍යාව	ආරම්භක දිනය	කාල සීමාව
ශ්‍රී.ලං.සං.ප. ආයතනයේ ඉංග්‍රීසි ඩිප්ලෝමාව - 2018 කණ්ඩායම - 2	III මට්ටම	20	2018.12.29	වසර 01
ශ්‍රී.ලං.සං.ප. ආයතනයේ ඉංග්‍රීසි ඩිප්ලෝමාව - 2019 කණ්ඩායම - 1	II, III මට්ටම්	44	2019.09.07	වසර 01
CEEP 2019 කණ්ඩායම-1	උසස්	25	2020.02.16	දින 12
CEEP 2019 කණ්ඩායම-1	මූලික	25	2020.02.16	දින 12
SLSS සහ SLArS නිලධාරීන් සඳහා කථන ශිල්ප පුහුණු වැඩසටහන		30	2019.12.27	දින 10
සංඛ්‍යාලේඛන නිලධාරීන් සඳහා සේවාරම්භක පුහුණු වැඩසටහන - සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව		45	24.08.2020	දින 7

11. සාමාන්‍ය පරිපාලනය

11.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

11.1.1 2020.12.31 දිනට සේවක සංඛ්‍යා පිළිබඳ තොරතුරු

	අනුමත සේවක සංඛ්‍යාව	දැනට සේවක සංඛ්‍යාව	පුරප්පාඩු
ජ්‍යෙෂ්ඨ	47	19	28
තෘතියික	24	12	12
ද්විතීයික	54	44	10
ප්‍රාථමික	41	29	12
මුළු	166	104	62

11.2 මානව සම්පත් කළමණාකරණය

11.2.1. ද්විතීයන හා ස්ථිර පදනම මත පහත සඳහන් තනතුරු පුරප්පාඩු පුරවා ඇත.

අනු අංක	තනතුර	පුරවන ලද තනතුරු සංඛ්‍යාව	බඳවා ගත් පදනම
01	අධ්‍යක්ෂ ජනරාල්(වැඩ බලන)	01	ද්විතීයන (secondment)
02	අධ්‍යක්ෂ(පාලන)	01	ද්විතීයන (secondment)
03	උපදේශක	01	ද්විතීයන (secondment)
04	කළමනාකරණ සහකාර	03	ද්විතීයන

12.1.2. විශ්‍රාම ගැනීම, ඉල්ලා අස්වීම, ස්ථාන මාරුවීම් සහ ද්විතීයන කාල සීමාව අවසන් වීම හේතුවෙන් පහත තනතුරු පුරප්පාඩු විය.

අනු අංක	තනතුර	පුරප්පාඩු සංඛ්‍යාව	පුරප්පාඩු වීමට හේතු
01	අධ්‍යක්ෂ ජනරාල් (වැඩ බලන) අතිරේක අධ්‍යක්ෂ ජනරාල්(පුහුණු සහ ඉගෙනුම්)	01	ස්ථාන මාරු
02	පරිපාලන නිලධාරී	01	විශ්‍රාම යාම
03	වැඩසටහන් නිලධාරී	02	ස්ථාන මාරු/ විශ්‍රාම යාම
04	මුදල් නිලධාරී	01	විශ්‍රාම යාම
05	කළමනාකරණ සහකාර	02	විශ්‍රාම යාම
06	කාර්යාල සහායක	02	විශ්‍රාම යාම/ ඉල්ලා අස්වීම

11.3. සැපයුම් කළමනාකරණය

සමාලෝචිත වර්ෂය තුළ ආයතනයේ පහත සඳහන් ක්ෂේත්‍ර නවීකරණය කර ඇත

අංකය	ප්‍රසම්පාදන වර්ගය	ව්‍යාපෘතිය සඳහා ඇස්තමේන්තු ගත මුළු පිරිවැය (රු.මි)	තථ්‍ය ගෙවීම් මුදල රු
	ප්‍රාග්ධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම		
	ගොඩනැගිලි සහ ව්‍යුහයන්		
1	බිම් මහලේ (G-B) නිල නිවාස කොටස ප්‍රතිසංස්කරණය කිරීමේ කටයුතු	0.94	939,644.70
2	තොරතුරු තාක්ෂණ විද්‍යාගාරය අලුත්වැඩියා කිරීමේ ශේෂ වැඩ (විද්‍යාගාරය 2)	1.26	1,257,647.10
3	තොරතුරු තාක්ෂණ විද්‍යාගාරය අලුත්වැඩියා කිරීමේ ශේෂ වැඩ (විද්‍යාගාරය 3)	1.19	1,184,414.44
4	අධ්‍යක්ෂ ජනරාල් කාර්යාලය සඳහා පැන්ට්‍රි කබඩ් සැකසීම සහ සවි කිරීම	0.22	211,356.00
5	නුවරඑළිය සංචාරක බංගලාවේ ජලාපවහන පද්ධතිය ප්‍රතිසංස්කරණය කිරීම	0.33	439,983.00
6	නේවාසිකාගාර දොරවල් අලුත්වැඩියා කිරීම	0.03	24,873.01
	ප්‍රාග්ධන වත්කම් අත්පත් කර ගැනීම		
	යන්ත්‍රසූත්‍ර හා උපකරණ අත්පත් කර ගැනීම		
7	බාහිර දෘඩ තැටිය අංක 5 මිලදී ගැනීම		64,500.00
8	SSD දෘඩ මිලදී ගැනීම	0.09	11,000.00
9	පරිගණක මුද්‍රණ යන්ත්‍ර මිලදී ගැනීම (අංක 01)		29,950.00
	කාර්යාල උපකරණ අත්පත් කර ගැනීම		
10	සීසීටීවී කැමරාව සැපයීම සහ ස්ථාපනය කිරීම		1,594,780.00
11	පොත් ස්කෑනර් යන්ත්‍රය මිලදී ගැනීම (අංක 01)	1.68	79,000.00
12	දර්ශන දුරකථන මිලදී ගැනීම		4,990.00
	විදුලි උපකරණ ලබා ගැනීම		
13	SPS සඳහා AC යන්ත්‍රය මිලදී ගැනීම (අංක 01)		121,500.00
14	සර්වරය ඇති කාමරය සඳහා AC යන්ත්‍රය මිලදී ගැනීම (අංක 01)	0,27	316,656.00
15	සිවිලිම් විදුලි පංකා මිලදී ගැනීම (අංක 10) සහ පාදස්තල විදුලි පංකා (අංක 05)		139,141.80
	මෘදුකාංග අත්පත් කර ගැනීම		
16	ප්‍රති-වයිරස විසඳුම් සැපයීම සහ ස්ථාපනය කිරීම	0.80	400,000.00
	වෙනත්		
17	පොත් සහ විද්‍යුත් පාඨ මාර්ග මිලදී ගැනීම	0.15	125,009.95

18	ස්පීකර මිලදී ගැනීම		3,500.00
19	බුරුසු කටර් යන්ත්‍රය මිලදී ගැනීම		15,500.00
20	තේ උණුසුම් මිලට ගැනීම		56,090.00
21	ඉණිමඟ මිලදී ගැනීම		10,500.00
22	සීතල ජල ද්‍රෝණිය මිලදී ගැනීම		86,138.64
23	හෙවි ඩියුටි ස්ටේප්ලර් යන්ත්‍රය මිලදී ගැනීම	0,19	4,750.00
24	වෙබ් කැමරා මිලදී ගැනීම (2ක්)		3,802.50
25	උද්‍යානය සඳහා හෝස් පයිප්පයක් මිලදී ගැනීම		5,800.00
26	නුවරඑළිය සංචාරක නිවාසය සඳහා හෝස් පයිප්ප කට්ටලයක් මිලදී ගැනීම		3,500.00
27	පාදයෙන් ක්‍රියා කළ හැකි ද්‍රෝණි මිලදී ගැනීම - 02 ක්.		21,600.00
28	වී ජී ඒ කාඩ් මිලදී ගැනීම		2,200.00
	මුළු මුදල		**7,157,827.14**



12. ආචාර්ය එච්.එස්. වනසිංහ පුස්තකාලය - පුස්තකාල හා තොරතුරු සේවා - ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය

පුහුණු පාඨමාලාවලට සහභාගී වන රාජ්‍ය / පෞද්ගලික අංශයේ විධායකයින්ගේ තොරතුරු අවශ්‍යතා සපුරාලීමට ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ පුස්තකාලය නිරතුරුව සිය සහාය ලබා දෙයි. ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ පුස්තකාලය රාජ්‍ය පරිපාලනය හා කළමනාකරණය හා සම්බන්ධ අධ්‍යයන ක්ෂේත්‍රයන්ට අදාළ නව පොත් රාශියකින් සමන්විත වන අතර එමගින් විශේෂයෙන් එහි පරිශීලකයින්ගේ අධ්‍යයන අවශ්‍යතා සපුරාලයි.

ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය නව පුහුණු පාඨමාලා හඳුන්වාදීම, පවතින පාඨමාලා යාවත්කාලීන කිරීම සහ උපදේශන හා පර්යේෂණ කටයුතු ක්‍රියාත්මක කිරීමෙහි නිරත වන අතර එම කාර්යයන් සඳහා අවශ්‍ය තොරතුරු ලබා ගැනීමට මෙම පුස්තකාලයෙන් පහසුකම් සැලසෙයි.

ආවරණය කරනු ලබන විෂය ක්ෂේත්‍ර

රජයේ ප්‍රතිපත්තිය, යහපාලනය, පෞරුෂ සංවර්ධනය, ආර්ථික සංවර්ධනය හා සැලසුම් කිරීම, පාරිසරික කළමනාකරණය, කාර්ය සාධන සංවර්ධනය, ඵලදායිතාව, ව්‍යාපෘති කළමනාකරණය, මානව සම්පත් කළමනාකරණය, ගෝලීයකරණය, පුද්ගලීකරනය, ඊ-පාලනය, ඊ-ව්‍යාපාර සහ තිරසාර සංවර්ධනය යන ක්ෂේත්‍රයන්ට අදාළ ග්‍රන්ථ පුස්තකාලයේ ඇත.

ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ පුස්තකාලය ග්‍රන්ථ පරිශීලනය සඳහා සඳුදා සිට සෙනසුරාදා රාත්‍රී 7.30 දක්වා විවෘතව පවතී. පුස්තකාලය ඉරිදා සහ රජයේ නිවාඩු දිනවල වසා ඇත. ඉගැන්වීම්, ඉගෙනුම් සහ පර්යේෂණ කටයුතු සඳහා මෙම පුස්තකාල උපකාරී වන අතර පුස්තකාලය පිළිබඳ තොරතුරු මාර්ගගත දත්ත ගබඩාවෙන් ද පුස්තකාල මාර්ගෝපදේශ සහ නියමු ලේබල වැනි මෙවලම් ඔස්සේ මෙන්ම පුස්තකාල කාර්ය මණ්ඩලයේ සහයෙන් ද ලබාගත හැකිය.

මෙයට අමතරව, පුද්ගලික අධ්‍යයන කටයුතු සඳහා පුස්තකාල භාවිතා කරන්නන්හට ලැප්ටොප්, විද්‍යුත් මුද්‍රණ සේවා සඳහා පහසුකම් සපයා ඇත. ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ පුස්තකාලයේ නොමැති පොත් සහ වාර සඟරා වෙනත් පුස්තකාලවලින් පුස්තකාල අන්තර් හුවමාරුව හරහා ලබා ගැනෙයි. තොරතුරු සම්පත්වල අවශ්‍ය මට්ටමේ ආරක්ෂාව පවත්වා ගැනීම සඳහා නිරීක්ෂණ කැමරා සවි කර ඇති අතර ඩිජිටල් තාක්ෂණය භාවිතයෙන් අවශ්‍ය මුද්‍රණ කටයුතු මනා ගුණාත්මකභාවයකින් හා කාර්යක්ෂමතාවකින් සිදු කෙරේ. පුස්තකාල ක්‍රියාකාරකම් ස්වයංක්‍රීය කිරීම සඳහා COHA මෘදුකාංගය භාවිතයෙන් සම්පාදනය කරන ලද දත්ත සමුදායකට ග්‍රන්ථ නාමාවලිය ද ඇතුළත් කර තිබේ.

සාමාජිකත්වය ලබා පුස්තකාලය පරිහරණය කරන්නන්

2020 මාර්තු සිට රට තුළ ඇති කෝවිඩ් 19 වසංගතය හේතුවෙන් ආයතනයේ පාඨමාලා මෙන්ම පුස්තකාල පරිහරණය ද සීමා කරන ලදී. ඒ අනුව පුස්තකාලය ආයතනයේ කාර්ය මණ්ඩලයට පමණක් විවෘත කරන ලද අතර බාහිර පරිශීලකයින්ගේ තොරතුරු අවශ්‍යතා ඉටු කිරීම සඳහා ඔවුන්ට අවශ්‍ය දෑ ස්කෑන් කර ඔවුන්ගේ විද්‍යුත් තැපෑලෙන් ඔවුන් වෙත ලබා දීමට කටයුතු කර ඇත. 2020 සඳහා පරිශීලකයින් 242 ක් සිටින අතර ඔවුන් පුස්තකාල සාමාජිකත්වය ලබා ඇති ආකාරය පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

අනු අංකය	පාඨමාලාවේ නම	සාමාජිකයින් සංඛ්‍යාව
1.	රාජ්‍ය කළමනාකරණපති උපාධි පාඨමාලාව	03
2.	ප්‍රසම්පාදන ක්‍රියාවලිය පිළිබඳ උසස් ඩිප්ලෝමාව	96*
3.	කාර්යාල කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාව	31
4.	ශ්‍රී ලංකාවේ සංවර්ධන පරිපාලන ආයතනයේ කාර්ය මණ්ඩලය	112**
	සමස්ත	242

* මෙම පාඨමාලාව අප්‍රේල් මස සිට මාර්ගගත ක්‍රමයට පවත්වා ඇති අතර පුහුණුකරුවන් ආයතනය වෙත නොපැමිණීම හේතුවෙන් ඔවුන් වෙත සාමාජික බලපත්‍ර නිකුත් කිරීමට නොහැකි විය.
** ආයතනයේ කාර්ය මණ්ඩලය සඳහා නව විද්‍යුත් පුස්තකාල සාමාජික බලපත්‍ර ලබා දෙන ලදී.

පුස්තකාල සාමාජිකත්වය රහිතව පුස්තකාලය පරිහරණය කිරීම
සාමාජිකත්වය නොමැතිව පුස්තකාල භාවිතය මේ වසරේ කෙටිකාලීන පාඨමාලා සඳහා පමණක් සීමා වූ බැවින් පුස්තකාල භාවිතය සීමා විය.

පුස්තකාල තොරතුරු සම්පත් අත්පත් කර ගැනීම

පොත්
පරිත්‍යාග ලෙස ලැබුණු පොත් සංඛ්‍යාව පහත පරිදි වේ

- අනුග්‍රහ ලෙස ලැබුණු - 64
- විශේෂ පරිත්‍යාග - 12

2020 දී පුස්තකාලයේ තොරතුරු සම්පත් ලබා ගැනීමේ මුළු පිරිවැය පහත පරිදි වේ.

මිළදී ගත් ද්‍රව්‍ය	පිරිවැය
ග්‍රන්ථ	152,943.30
වාර ප්‍රකාශන(දේශීය)	1,800.00
වාර ප්‍රකාශන(විදේශීය)	24,084.00
පුවත්පත්	166,970.00
මුළු	345,797.00

මේ වසරේ නොවැම්බරයේදී පුස්තකාල පොත් සමීක්ෂණය ආයතනයේ පාලන අංශය විසින් පවත්වන ලදී.



13. 2020 වසර තුළ ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ විශේෂ සිදුවීම්

i. හැදෙන රටක් වැඩෙන ගසක්" - 2020 ජනවාරි 01 දින

"හැදෙන රටක් වැඩෙන ගසක්" යන තේමාව පදනම් කරගෙන ජාතික ගස් සිටුවීමේ ව්‍යාපාරය - ශ්‍රී ලං. සං. පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් සහ කාර්ය මණ්ඩලය විසින් 2020 ජනවාරි මස 1 වන දින පෙ.ව. 9.49 ට ශ්‍රී ලං. සං. පරිපාලන ආයතනයේ උද්‍යානයේ වටිනා ගස් හා පළතුරු ගස් කිහිපයක් රෝපණය කරන ලදී. මෙම උත්සවය ජ්‍යෙෂ්ඨ උපදේශක කේ.ආර් ගංගාධාර, අධ්‍යක්ෂ (පාලන), වයි. අනිරුත්තනන්, අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පරිපාලන හා මූල්‍ය), ප්‍රසාද් පියසේන මහතා, සුදත් අල්විස් මහතා ශ්‍රී ලං. සං. පරිපාලන ආයතනයේ හරිත කණ්ඩායම සමඟ එක්ව සංවිධානය කරන ලදී.



ii. ප්‍රසිද්ධ දේශනය

ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ පශ්චාත් උපාධි අධ්‍යයන ආයතනය 2020 ජනවාරි 16 වන දින ශ්‍රී ලං. සං. පරිපාලන ආයතනයේ ශ්‍රවණාගාරයේදී "පරිපාලන තීරණ ගැනීම - මානව හිමිකම් ඉදිරි දර්ශනය" පිළිබඳ ප්‍රසිද්ධ දේශනයක් පැවැත්වීය. මෙය පශ්චාත් උපාධි අධ්‍යයන ආයතනය විසින් 2020 වර්ෂය තුළ පැවැත්වීමට සැලසුම් කර තිබූ දේශන මාලාවේ පළමු වන දේශනයයි. දේශකයා වූයේ බටහිර ඉන්දීය කොදෙව්හි ජැමෙයිකා තාක්ෂණ විශ්ව විද්‍යාලයේ නීති පීඨයේ පීඨාධිපති, නීතිය පිළිබඳ මහාචාර්ය ආචාර්ය ප්‍රතිභා මහානාමහේවා මහතාය.





iii. "පුද්ගලික අංශයේ හොඳම පරිචයෙන්: රාජ්‍ය අංශයට පාඩම්" පිළිබඳ ආරාධිත දේශනය.

පශ්චාත් උපාධි අධ්‍යයන පාසල විසින් 2020 පෙබරවාරි 13 වන දින සංඛතනි ශාලාවේදී "පුද්ගලික අංශයේ හොඳම පරිචයෙන්: රාජ්‍ය අංශයට පාඩම්" පිළිබඳ ප්‍රසිද්ධ දේශනයක් සංවිධානය කරන ලදී. මෙය 2020 වසර තුළ පැවැත්වීමට සැලසුම් කර තිබූ දේශන මාලාවේ 2 වන දේශනය වූ අතර සණස සංවර්ධන බැංකුවේ ප්‍රධාන විධායක නිලධාරී තිලක් පියදිගම මහතා විසින් දේශනය පවත්වනු ලැබිණි.







iv. ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ නිලධාරීන්ට නව පත්වීම් ප්‍රදානය කිරීම

ශ්‍රී ලංකා ක්‍රම සම්පාදන සේවයට අලුතින් බඳවා ගත් නිලධාරීහු හැත්තෑපස් දෙනෙකු ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ සිය සේවාරම්භක පුහුණුව සම්පූර්ණ කොට 2020 පෙබරවාරි 7 වන දින රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍ය ගරු ජනක බණ්ඩාර තෙන්නකෝන් මහතා අතින් සිය පත්වීම් ලිපි ලබා ගත්හ. එම උත්සවය ශ්‍රී ලං. සං. පරිපාලන ආයතනයේ ශ්‍රවණාගාරයේ "සංහිද" ශාලාවේදී පෙරවරු 11.00 සිට පැවැත්විණි. අමාත්‍යාංශයේ ලේකම් එස්. හෙට්ටිආරච්චි මහතා, අතිරේක ලේකම්වරුන්, ශ්‍රී ලං. සං. පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් සහ පීඨ සාමාජිකයින් මෙම අවස්ථාවට සහභාගී වූහ.

මොඩියුල 17 කින් සමන්විත වූ සේවාරම්භක පුහුණු වැඩසටහන මාස 06 ½ ක කාලයක් පැවති අතර එයට එක් මාසයක අමාත්‍යංශ, පළාත්, දිස්ත්‍රික් හා ප්‍රාදේශීය මට්ටමින් ක්ෂේත්‍ර පුහුණුවක් සහ බහිර්ගාමී පුහුණුවක් ද ඇතුළත් විය.

අමාත්‍යාංශයේ ලේකම් එස්. හෙට්ටිආරච්චි මහතා සිය දේශනයේදී අවධාරණය කළේ රටේ සියලු සංවර්ධන කටයුතු ක්‍රමසම්පාදන නිලධාරීන්ට භාර දෙන බවත් ඒ නිසා මහජන මුදල් පොදු ජනතාවගේ සුභසාධනය සඳහා යොදා ගැනීමේ වගකීම ඔවුන් සතු බවත්ය. සංවර්ධන ව්‍යාපෘතිවල තිරසාරභාවය පිළිබඳව අවධානය යොමු කළ යුතු බවද ඔහු පැවසීය. ශ්‍රී ලං. සං. පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් (වැඩබලන) කේ.එම්.එස්.ඩී. ජයසේකර සහ සේවාරම්භක පුහුණු වැඩසටහනේ සමස්ත සම්බන්ධීකාරක ලෙස කටයුතු කළ ජ්‍යෙෂ්ඨ උපදේශිකා නෙරංජලා ජයසුන්දර මහත්මිය ද මෙම සභාව අමතන ලදී.









v. කොවිඩ් -19 වසංගතය තුළ රාජ්‍ය අංශයේ කළමනාකරුවන්ගේ කාර්යභාරය පිළිබඳ වෙබ් සම්මන්ත්‍රණය

පශ්චාත් උපාධි අධ්‍යයන ආයතනය විසින් 2020 මැයි 06 වන දින "කොවිඩ් - 19 වසංගත කාල සීමාව තුළ රාජ්‍ය අංශයේ කළමනාකරුවන්ගේ කාර්යභාරය" පිළිබඳ වෙබ් සම්මන්ත්‍රණ මාලාවක් සංවිධානය කරන ලදී. මෙය 2020 වර්ෂය තුළ පැවැත්වීමට සැලසුම් කර තිබූ දැනුවත් කිරීමේ වැඩසටහන් මාලාවේ තෙවන දේශනය විය. පශ්චාත් උපාධි අධ්‍යයන ආයතනයේ වැඩබලන අතිරේක අධ්‍යක්ෂ ජනරාල් ආචාර්ය සේපාලිකා සුදසිංහ මහත්මිය විසින් මෙය පවත්වන ලදී.



vi. වසංගත කාල සීමාව තුළ අඛණ්ඩ සේවයක් සැපයීම

කොවිඩ් 19 වසංගතය අවසන් වන තෙක් ජනතාව ආරක්ෂා කිරීම සඳහා රජයේ ක්‍රියාමාර්ගයන්ට සහාය වීමට ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය පියවර කිහිපයක් ගෙන ඇති අතර එම කාලය තුළ රාජ්‍ය සේවයේ ධාරිතාව වර්ධනය කිරීමටද කටයුතු කර ඇත.

- ආරම්භයේදීම ශ්‍රී ලං. සං. පරිපාලන ආයතනය විසින් සිය නේවාසිකාගාර සංකීර්ණයම ජීවිත බේරා ගැනීම සඳහා කැපවී සිටින රජයේ රෝහල්වල වෛද්‍ය නිලධාරීන්ගේ පරිහරණය සඳහා වෙන් කරන ලදී.

- වසංගතයෙන් ජනතාව ආරක්ෂා කිරීම සඳහා වන ජාතික කර්තව්‍යයට දායක වීම සඳහා අති ගරු ජනාධිපතිතුමාගේ සංකල්පයක් මත පිහිටුවන ලද අරමුදලට ශ්‍රී ලං. සං. පරිපාලන ආයතනයෙහි සියලුම කාර්ය මණ්ඩලයේ සියලුම සාමාජිකයෝ තම එක් දිනක වැටුප පරිත්‍යාග කළහ.

- සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් නිකුත් කරනු ලැබූ සියලුම මාර්ගෝපදේශ දැඩි ලෙස පිළිපැදීම සහතික කරමින් රජයේ නිලධාරීන් පුහුණු කිරීමට ද ශ්‍රී ලං. සං. පරිපාලන ආයතනය කටයුතු කළ අතර, එකී කටයුතු ආරම්භ කිරීමට පෙර කොළඹ මහ නගර සභාවේ සහාය ඇතිව නිරෝධායන නීති නිසි පරිදි අනුගමනය කිරීමට ශ්‍රී ලං. සං. පරිපාලන ආයතනය කටයුතු කරන ලදී.

- ආරම්භයේ දී, ශ්‍රී ලං. සං. පරිපාලන ආයතනය විසින් ඉහත කී පරිදි වෛද්‍ය නිලධාරීන්ට ලබා දී තිබූ අදාළ නේවාසිකාගාර පරිශ්‍රවලින් ඔවුන් ඉවත්ව යන තෙක් සියලුම පීඨවල හා කළමනාකරණ කාර්ය මණ්ඩලයේ සාමාජිකයෝ මාර්ගගත ක්‍රමයට සිය සේවාවන් පවත්වාගෙන යාමට කටයුතු කළහ. පසුව, සිය කාර්ය මණ්ඩලයෙන් 50% පමණ සතියට දින දෙකක් වනම් අඟහරුවාදා දින සහ බ්‍රහස්පතින්දා දිනවල ආයතනය වෙත ගෙන්වා ගැනීමට ශ්‍රී ලං. සං. පරිපාලන ආයතනය කටයුතු කළේය. තත්ත්වය සැලකිය යුතු මට්ටමකට පාලනය වී තිබූ හෙයින්, සතියකට දින හතරක් ශ්‍රී ලං. සං. පා ආයතනය විවෘත කිරීමට කටයුතු කළ අතර, අදාළ පිරිස් සමග සාකච්ඡා කිරීමෙන් අනතුරුව සේවකයින්ට කාර්යාලය වෙත නොපැමිණ මාර්ගගත ක්‍රමයට සිය රාජකාරී කිරීමට කැමති දිනයක් තෝරා ගැනීමට අවස්ථාව ලබා දෙන ලදී.

- වසංගත කාල සීමාව තුළ ජනතාවගේ අභිවෘද්ධිය සඳහා කැපවී කටයුතු කළ දිස්ත්‍රික් ලේකම්වරුන් හා ප්‍රාදේශීය ලේකම්වරුන් වැනි උසස් මට්ටමේ නිලධාරීන් දිරිගැන්වීම සඳහා ශ්‍රී ලං. සං. පරිපාලන ආයතනය විසින් මෙම කාල පරිච්ඡේදය තුළදී වෙබ් සම්මන්ත්‍රණ මාලාවක් පැවැත්වීමට කටයුතු කරන ලදී.

- ඒ අනුව ශ්‍රී ලං. සං. පරිපාලන ආයතනය විසින් මෙම දේශන මාලාවේ සම්බන්ධීකාරකවරුන් මෙන්ම සම්පත්දායකයින් සඳහා මාර්ගෝපදේශ මාලාවක් සකස් කර ඇත. වෙබ් සම්මන්ත්‍රණ මාලාව මඟින් ඔවුන් දැනුවත් කිරීමට යෝජනා කරන ක්ෂේත්‍ර පහත දැක්වේ.

- ව්‍යාපාර අඛණ්ඩතාව සඳහා ව්‍යවසායකත්ව ප්‍රතිවර්තනය.

- අවදානම් කළමනාකරණය: ප්‍රාදේශීය මට්ටමේ කුඩා ව්‍යවසායකයින්ගේ සාර්ථකත්වයට මග

- ප්‍රතිඵල මත පදනම් වූ සැලසුම් - ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල නිලධාරීන්ගේ කාර්යභාරය.

- දත්ත මත පදනම්ව තීරණ ගැනීම සඳහා ඩිජිටල් පරිවර්තනය හරහා සමාජ දුරස්ථභාවය ප්‍රවර්ධනය කිරීම - ශ්‍රී ලංකාව තුළ සුහුරු රාජ්‍ය පාලනයක් සඳහා ප්‍රතිපාදන.

- ආපදා තත්වයක් තුළ අඛණ්ඩව කාර්යයන් ඉටු කිරීම

- කොවිඩ් -19 තුළ මූල්‍ය විනය පවත්වා ගැනීම - රාජ්‍ය සේවාවන් සැපයීම.

- කොවිඩ් -19 වසංගතය තුළ රාජ්‍ය සේවා කළමනාකරුගේ කාර්යභාරය. ඉහත වැඩසටහන් වලට අමතරව, ශ්‍රී ලං. සං. පරිපාලන ආයතනයේ පශ්චාත් උපාධි අධ්‍යයන ආයතනය පහත දැක්වෙන

පරිදි විසරණ ක්‍රම තුනක් භාවිතා කරමින් රාජ්‍ය කළමනාකරණපති උපාධි වැඩසටහන ආරම්භ කළේය.

* ඊ ඉගෙනුම් මාදිලිය
* මයික්‍රොසොෆ්ට් ටීම්
* මිශ්‍ර ඉගෙනුම් මාදිලිය භාවිතා කරමින් ශ්‍රව්‍යමය වශයෙන් පවර් පොයින්ට් ඔස්සේ ඉදිරිපත් කිරීම් හා නිවාසස්ථ පැවරුම් ලබා දීම.

■ ශ්‍රී ලං. සං. පරිපාලන ආයතනයෙහි සාමාන්‍ය කාර්ය මණ්ඩලය මෙම කාල සීමාව තුළ පහත සඳහන් දෑ සම්බන්ධයෙන් දැනුම්වත් කරන ලදී.

* සන්නිවේදන කුසලතා සහ මහජන සම්බන්ධතා
* පන්ති කාමර උපකරණ හැසිරවීමේ මූලික අවශ්‍යතා
* ලිපි ගොනු හැසිරවීම සහ නඩත්තු කිරීම
* මූලික මූදල් රෙගුලාසි
* ලිපි ලිවීම, මේමෝ, ඊමේල් ලිවීම
* මූලික ඵලදායිතාව
* තොරතුරු තාක්ෂණ යෙදවුම්
* රාජ්‍ය ප්‍රසම්පාදනය
* ගබඩා කළමනාකරණය සහ තොග ලේඛන කළමනාකරණය
* භාෂා කුසලතා
* සෞඛ්‍ය හා පෝෂණය / ආතතියෙන් මිදීම / ජීවන සමතුලිතතාවය පවත්වා ගැනීම / ආහාර ගැනීමේ ආචාර විධි.

පරිපාලන ශ්‍රේණියේ ග්‍රාම නිලධාරීන් 53 දෙනෙකු සඳහා නේවාසික වැඩසටහනක් ලෙස ශ්‍රී ලං. සං. පරිපාලන ආයතනය විසින් දින හයක් පුරා දිශානති පුහුණු වැඩසටහනක් පවත්වන ලදී. මෙම විෂයයන් ඔවුන්ගේ එදිනෙදා කටයුතු සඳහා ඉතා වැදගත් යැයි හඳුනාගෙන ඇති අතර වැඩසටහනේ ප්‍රධාන ක්ෂේත්‍ර පහත දැක්වේ.

* නායකත්වය සහ අභිප්‍රේරණය
* ප්‍රාදේශීය මට්ටමින් ජාතික ප්‍රතිපත්ති හා වැඩසටහන් ලබා දීම සඳහා ඒකාබද්ධව සහභාගීත්වය
* මූලික ස්වයංක්‍රීය යෙදවුම්
* පුරවැසි කේන්ද්‍රීය පරිපාලනය සඳහා රජයේ අවධානය
* ධනාත්මක ප්‍රවේශය
* මූලික නිල කාර්යයන්
* රාජ්‍ය අංශයේ විනය කළමනාකරණය
* මුදල් රෙගුලාසි

• ශ්‍රී ලං. සං. පරිපාලන ආයතනයෙහි පවතින මොඩියුල 4, වනම් සැලසුම් කිරීම, සංවර්ධනය කිරීම, යෙදවීම සහ බෙදා හැරීම මත පදනම්ව, දීප ව්‍යාප්ත සේවාවන්හි ධාරිතා සංවර්ධනය කිරීම පිණිස නව මොඩියුල සහ ක්‍රියාකාරකම් වෙහි පීඨ හා කළමණාකාරිත්වය විසින් සකස් කරන ලදී. වසංගත කාල සීමාව තුළ හඳුන්වා දුන් දුරස්ථකරණය යන සංකල්පය අනුගමනය කරමින්, අදාළ නිලධාරීන් කොළඹට කැඳවා ගැනීමෙන් තොරව, III, I සහ විශේෂ ශ්‍රේණිවල නිලධාරීන් හට මාර්ගගත ක්‍රමයට වැඩසටහන් ලබා දෙනු ලබයි.

• ඒ අතරම, ශ්‍රී ලං. සං. පරිපාලන ආයතනය සිය සමාජ වගකීම් අමතක කර නොමැති අතර, ශ්‍රී ලං. සං. පරිපාලන ආයතනයෙහි සියලුම කාර්ය මණ්ඩල සාමාජිකයින් විසින් අරමුදලක් පිහිටුවා, ස්වේච්ඡාවෙන් ඒ සඳහා මුදල් බැර කර ශ්‍රී ලං. සං. පරිපාලන ආයතනය ක්‍රියාත්මක නොවූ කාල සීමාව තුළ රැකියා විරහිත ව සිටීමට සිදු වූ වෙහි පිරිසිදු කිරීමේ සේවයේ කාර්ය මණ්ඩලයට සහාය වීමට පියවර ගෙන තිබේ.

අපගේ මාතෘ භූමියේ කොවිඩ් -19 පැතිරීම පාලනය කිරීම සඳහා සෞඛ්‍ය මාර්ගෝපදේශ දැඩි ලෙස පිළිපදින අතරම සිය හරිත පරිසරය පවත්වා ගැනීමට ද ශ්‍රී ලං. සං. පරිපාලන ආයතනය කටයුතු කළේය.









vii. ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් තනතුර

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධාරිනියක වන ශ්‍රී ලං. සං. පරිපාලන ආයතනයෙහි වැඩබලන අධ්‍යක්ෂ ජනරාල් ලෙස කටයුතු කළ කේ.එම්.එස්. ඩී. ජයසේකර මහත්මිය 2020 අගෝස්තු 25 දින සිට ක්‍රියාත්මක වන පරිදි කාන්තා හා ළමා කටයුතු, පෙර පාසල් අධ්‍යාපන, පාසල් යටිතල පහසුකම් හා අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම් ලෙස අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා විසින් පත් කරනු ලැබ ඇත.

රාජ්‍ය සේවා, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ අතිරේක ලේකම්, ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධාරිනී ප්‍රදීපා සේරසිංහ මහත්මිය, පුරප්පාඩු වූ අධ්‍යක්ෂ ජනරාල් තනතුරට වැඩබලන පදනම මත පත් කර තිබේ. ශ්‍රී ලං. සං. පරිපාලන ආයතනය එම නිලධාරිනියන් දෙදෙනාටම සුබ පැතුම් පිරිනමයි.



viii. රට වෙනුවෙන් වැඩ කිරීමේ සංස්කෘතියක්" යන මැයෙන් වූ ආරාධිත දේශනය

පශ්චාත් උපාධි අධ්‍යයන ආයතනය විසින් 2020 සැප්තැම්බර් 3 සහ 5 යන දිනවල සංඛතනි ශාලාවේදී "රට වෙනුවෙන් වැඩ කිරීමේ සංස්කෘතියක්" යන මැයෙන් දේශනයක් සංවිධානය කරන ලද අතර මෙය පශ්චාත් උපාධි අධ්‍යයන ආයතනය විසින් පැවැත්වීමට සැලසුම් කර තිබූ දේශන මාලාවේ 4 වන දේශනයයි. කොළඹ විශ්ව විද්‍යාලයේ මහාචාර්ය (ආචාර්ය) ඩී.ඒ.සී.සිල්වා මහතා විසින් දේශනය පවත්වන ලදී.



ix. ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය ආයතනය සිය හරිත උද්‍යානයේ ඖෂධ පැළ සිටුවමින් "සුව ධරණි" ජාතික වැඩසටහනට දායක වීම.

සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කරනු ලබන "සුව ධරණි" ජාතික වැඩසටහන හා සමගාමීව පවත්වන "ආයුර්වේද වෛද්‍ය දිනයට" සමගාමීව, ශ්‍රී ලං. සං. පරිපාලන ආයතනය විසින් 2020 සැප්තැම්බර් 17 වන දින සිය හරිත උද්‍යානයේ ඖෂධ පැළෑටි රෝපණය කිරීමේ වැඩසටහන ආරම්භ කරන ලදී.

මෙම අවස්ථාවට ශ්‍රී ලං. සං. පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් (වැඩ බලන) ප්‍රදීපා සේරසිංහ මහත්මිය සහ අධ්‍යයන කාර්ය මණ්ඩලය සහ කළමනාකරණ කාර්ය මණ්ඩලය සහභාගී විය. ඔවුන් ඖෂධීය වටිනාකමක් ඇති පොකුරු වදමල් විශේෂ සහ ඉඟුරු රයිසෝම රෝපණය කළහ. මෙම උත්සවය ශ්‍රී ලං. සං. පරිපාලන ආයතනයේ පාලන අංශය විසින් සංවිධානය කරන ලද්දක් වූ අතර එය හරිත නගරයක් ඇතිකිරීම සහ ඖෂධීය ශාක රෝපණය යන සංකල්ප අඩංගු අතිගරු ජනාධිපතිතුමාගේ "සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශය සමග අනුගත වේ.



14. විගණන කමිටුවේ වාර්තාව

පො.ව්‍යා.දෙ/12 චක්‍රලේඛයේ 7.4.1 ඡේදයේ විධිවිධාන ප්‍රකාරව විගණන කමිටුව දැනට සාමාජිකයින් තිදෙනෙකුගෙන් සමන්විත වන අතර එය ආයතනයේ අවංක භාවය සහතික කිරීම, ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව කාලානුරූපව සම්පාදනය කරන ලද ගුණාත්මක මූල්‍ය ප්‍රකාශන, ප්‍රමාණවත් අභ්‍යන්තර පාලනයන් සහ අවදානම් කළමනාකරණය සහිත මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සහතික කිරීම යන පාලක මණ්ඩලයේ කටයුතු ඉටු කිරීම සඳහා සහාය දක්වයි.

විගණන හා කළමනාකරණ කමිටුව
සංයුතිය සහ රැස්වීම්

2020 වර්ෂය සඳහා පාලක සභාව විසින් පත් කරන ලද විගණන කමිටුවේ සාමාජිකයෝ පහත පරිදි වෙති.

- පී. අල්ගම මහතා — භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්, මුදල් අමාත්‍යාංශය
- සුමිත් අබේසිංහ මහතා — ශ්‍රී ලං. සං. පරිපාලන ආයතනයේ පාලක සභාවේ සාමාජික
- කෞෂාල් මෙන්ඩිස් මහතා — ශ්‍රී ලං. සං. පරිපාලන ආයතනයේ පාලක සභාවේ සාමාජික
- ආර්.ජී පණ්ඩිත කෝරාළගේ මහතා — ශ්‍රී ලං. සං. පරිපාලන ආයතනයේ පාලක සභාවේ සාමාජික

2020 දෙසැම්බර් 31 න් අවසන් වූ වර්ෂය සඳහා විගණන කමිටුවේ ලේකම් ලෙස අභ්‍යන්තර විගණක වරයා කටයුතු කරන ලදී. වර්ෂය තුළ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් දෙකක් (AMC) පවත්වන ලදී. රජය විසින් සිදුකරන ලද වෙනස්කම් සහ විගණන හා කළමනාකරණ කමිටු සාමාජිකයින් නම් කිරීමට ප්‍රමාද වීම හේතුවෙන් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් නියමිත පරිදි නොපැවැත්විණි. විගණන හා කළමනාකරණ කමිටු සාමාජිකයින් 2019.09.10 දින පත් කරන ලදී.තෙවන සහ සිව්වන කාර්තු සඳහා විගණන හා කළමනාකරණ කමිටු සාමාජිකයින් පත් කිරීමෙන් අනතුරුව පාලක සභා රැස්වීම් පවත්වන ලද අතර 2020 දී විගණන කමිටුව විසින් සාකච්ඡා කරන ලද ප්‍රධාන න්‍යාය පත්‍ර අයිතම පහත පරිදි වේ.

රැස්වීම් අංක සහ දින	සාකච්ඡා කරන ලද අයිතම
2020/01 - 27.10.2020	• ශ්‍රී.ලං.ස.ප. ආයතනයේ 2021 අයවැය
	• ශ්‍රී.ලං.ස.ප. ආයතනයේ 2021 ප්‍රසම්පාදන සැලසුම
	• ව්‍යවස්ථාපිත බැඳීම්වල තත්ත්වය
	• 2018/2019 අභ්‍යන්තර විගණන විමසුම් හා පිළිතුරු
2020/02 - 15.12.2020	• අභ්‍යන්තර විගණන සැලසුම 2021
	• 2018/2019/2020 අභ්‍යන්තර විගණන වාර්තා සහ අවධානය යොමු කරන ලද කරුණු

විගණකාධිපති දෙපාර්තමේන්තුවේ නියෝජිත, විගණන අධිකාරී එම්.ආර්.ආර්.කේ. මල්ලව මහත්මිය නිරීක්ෂකයෙකු ලෙස සහභාගී විය. ඊට අමතරව, රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශයේ ප්‍රධාන අභ්‍යන්තර විගණකවරයා ද ශ්‍රී ලං. සං. පරිපාලන ආයතනයේ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමේ නිරීක්ෂකයෙකු වශයෙන් සහභාගී විය. නිශ්චිත කරුණු සම්බන්ධයෙන් විගණන කමිටුව වෙත සැකෙවින් කරුණු ඉදිරිපත් කිරීම සඳහා ශ්‍රී ලං. සං. පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් සහ ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය වෙත වරින් වර කැඳවීම් කරන ලදී.

නිර්ණිත විෂයය

පොදු ව්‍යාපාර චක්‍රලේඛ අංක 55 ප්‍රකාරව පාලක සභා සාමාජිකයින් විසින් නියම කරන ලද විශේෂිත නිර්ණිත විෂයය (TOR) මගින් මෙම කමිටුව මෙහෙයවනු ලබයි. නිර්ණය විෂයය සහ රජයේ අවශ්‍යතාවන්ට අනුව සිය වගකීම් ඉටුකිරීමේදී පහත දැක්වෙන ඉලක්ක කෙරෙහි කමිටුවේ අවධානය යොමු වේ.

අ. අභ්‍යන්තර විගණන ඒකකයේ වගකීම් තීරණය කිරීම සහ වාර්ෂික විගණන සැලසුම් සමාලෝචනය කිරීම.
ආ. ආයතනයේ සියලුම ක්‍රියාකාරකම් සඳහා අභ්‍යන්තර පාලන පද්ධති සමාලෝචනය කිරීම සහ ඇගයීම.
ඇ. පිරිවැය ඵලදායීතාවය සහ නාස්තිකාර වියදම් ඉවත් කිරීම සඳහා නියමිත කාලසීමාව තුළ කාර්ය සාධනය සමාලෝචනය කිරීම.
ඈ. බාහිර විගණකවරුන් සමඟ සම්බන්ධ වී විගණකාධිපතිවරයාගේ / බාහිර විගණකවරුන්ගේ කළමනාකරණ ලිපි පිළිබඳ පසු විපරම් කිරීම.
ඉ. ප්‍රඥප්ති, රෙගුලාසි, රීති සහ චක්‍රලේඛවලට අනුකූලද යන්න සොයා තහවුරු කර ගැනීම.
ඊ. ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූල වීම සහතික කිරීම සඳහා මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය කිරීම.
උ. අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සඳහා අභ්‍යන්තර විගණන / බාහිර විගණන වාර්තා, කළමනාකරණ ලිපි සමාලෝචනය කිරීම.
ඌ. රාජ්‍ය ව්‍යවසාය පිළිබඳ කාරක සභාවේ නිර්දේශ / නියෝග ක්‍රියාත්මක කිරීම සමාලෝචනය කිරීම.
එ. කමිටුව විසින් සලකා බැලිය යුතු, ක්‍රියා කළ යුතු හෝ වැඩිදියුණු කළ යුතු බව හඳුනාගෙන ඇති කරුණු පාලක සභාවට වාර්තා කිරීම.
ඒ. වාර්ෂික වාර්තාවට ඇතුළත් කිරීම සඳහා කමිටුවේ සොයා ගැනීම් පිළිබඳ වාර්තාව සකස් කිරීම.

මූල්‍ය වාර්තාකරණය

පාර්ශ්වකරුවන්ට ලබා දී ඇති තොරතුරුවල විශ්වාසනීයත්වය සහතික කිරීම සඳහා කමිටුව විසින් මූල්‍ය වාර්තාකරණ පද්ධතියේ ඵලදායීතාවය සමාලෝචනය කරනු ලබයි. ගිණුම් පොත් සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා ඔවුන්ගේ වගකීම ඉටු කිරීමට කමිටුව පාලක සභාවට සහාය වේ. සියලුම ගනුදෙනු නිවැරදිව හා සම්පූර්ණයෙන් ගිණුම් පොත්වල සටහන් කර ඇති බවට සාධාරණ සහතිකයක් ලබා දීම සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ ප්‍රමාණවත් බව සහ ඵලදායීතාව පිළිබඳ කමිටුව සමාලෝචනය කරයි.

කමිටුව විසින් මූල්‍ය ප්‍රකාශන සැකසීමේදී සකස් කරන ලද වැදගත් උපකල්පන සහ විනිශ්චයන් ඇතුළත් ආධාරක තොරතුරු සමඟ සියලුම විගණනය නොකරන ලද කාර්තුමය අතුරු මූල්‍ය ප්‍රකාශන සහ මූල්‍ය ප්‍රකාශන, සමාලෝචනය කර ඇත.

අභ්‍යන්තර පාලනය

විගණන කමිටුව 2020 දෙසැම්බර් 31 දින වන විට මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අභ්‍යන්තර පාලනයේ ඵලදායීතාවය තක්සේරු කර ඇත. මෙම ක්‍රියාවලිය අභ්‍යන්තර පාලනයන්හි ප්‍රමාණවත් බව සහ ඵලදායීතාවය සහතික කරන අතර නීති හා රෙගුලාසි වලට අනුකූලව අවදානම් පාලනය කිරීමේ ක්‍රියාවලියද තක්සේරු කරනු ලබයි. ශ්‍රී ලං. සං. පරිපාලන ආයතනයේ අභ්‍යන්තර පාලන පද්ධතියේ ඵලදායීතාව වැඩි දියුණු කිරීම සඳහා අභ්‍යන්තර විගණකවරුන්ගේ නිර්දේශ මත කළමනාකාරිත්වය විසින් සුදුසු ක්‍රියාමාර්ග ගන්නා බව කමිටුව සහතික කරයි. අභ්‍යන්තර පාලන රාමුවේ පදනම, පාලක මණ්ඩලයට එහි කාර්යයන් කරගෙන යාමට සහ අවශ්‍ය පියවර ගැනීමට ඉඩ සලසයි.

අභ්‍යන්තර විගණනය

අභ්‍යන්තර විගණන කාර්යය විගණනය කරන ක්‍රියාකාරකම් වලින් ස්වාධීන වන බවත් එය අපක්ෂපාතී ප්‍රවීණතාවයෙන් හා නිසි වෘත්තීය රැකවරණයෙන් යුතුව සිදු කරන බවට විගණන කමිටුව සහතික කරයි. ශ්‍රී ලං. සං. පරිපාලන ආයතනයේ අභ්‍යන්තර විගණන අංශයේ ක්‍රියාකාරකම්වල විෂය පථය, සම්පත්, වපසරිය හා ඵලදායීතාව පරිපාලන විගණන කමිටුව විසින් අධීක්ෂණය කර සමාලෝචනය කරන ලදී.

පී.අල්ගම
සභාපති
විගණන හා කළමණාකරන කමිටුව





විගණකාධිපති වාර්තාව

ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය

2020

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. } EHA/C/ SLIDA /03/2020/ 13 මෙම අංකය உமது இல. Your No. } දිනය திகதி Date } 2021 ජූනි 30 දින

අධ්‍යක්ෂ ජනරාල්

ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය

ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. **මූල්‍ය ප්‍රකාශන**

1.1 **තත්ත්වාගණනය කළ මතය**

ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, ආයතනයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.auditorgeneral.gov.lk

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 01 ප්‍රකාරව අවශ්‍ය කෙරෙන හෝ අවසර දී ඇති විටක හැරෙන්නට වත්කම් හා වගකීම් එකිනෙකට හිලව් නොකළ යුතු වුවත් ධාරිතා වර්ධන වැඩසටහන සඳහා රු.2,767,628 ක ලැබිය යුතු ශේෂයක් එම වැඩසටහනට අදාලව ගෙවිය යුතු ශේෂයට හිලවිකර මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ආ) ඉකුත් වර්ෂයේදී කෙරීගෙන යන වැඩ සඳහා දරා තිබුණු රු.1,644,344 ක් සමාලෝචිත වර්ෂයේ වැය දැරීමක් ලෙස මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශයේ දක්වා තිබූ අතර සම්පූර්ණයෙන් ක්ෂය කර තිබුණු පිරිවැය රු. 5,815,051 ක් වූ වත්කම් ශ්‍රී ලංකා යුධ හමුදාවට පවරා දීමද මුදල් පිටතට ගලා යාමක් ලෙස මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශයෙහි දක්වා තිබුණි.

(ඇ) සම්පූර්ණයෙන් ක්ෂය කර තිබුණු නමුත් දැනට භාවිතා කරනු ලබන පිරිවැය රු. 171,405,969 ක් වූ ස්ථාවර වත්කම්වල ඵලදායී ජීවිත කාලය රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 03 ප්‍රකාරව නැවත තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) අත්පත් කර ගැනීම් විස්තර දක්වා නොතිබුණු විදුලි ජනක යන්ත්‍රයක් දැනටමත් භාවිතා කරමින් පැවතිය ද එම යන්ත්‍රයේ වටිනාකම තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කර නොතිබුණු අතර රු. 400,000 කට මිලට ගත් ප්‍රතිවයිරස් මෘදුකාංගයක් ප්‍රාග්ධනිත නොකර සමාලෝචිත වර්ෂයේදී අයහාර වියදමක් ලෙස ආදායමට ලියා හැර තිබුණි.

(ඉ) විදුලි ජනක යන්ත්‍රය අළුත්වැඩියා කිරීම වෙනුවෙන් ගෙවිය යුතු රු. 530,532 ක මුදල උපචිත වියදම් ලෙස ගිණුම්ගත කර නොතිබීම නිසා සමාලෝචිත වර්ෂයේ අතිරික්තය එම ගණනින් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දැක්වුණි.

(ඊ) කලමනාකරණ සහකාර ඩිප්ලෝමා වැඩසටහන සඳහා 2014 වර්ෂයේ ලද රු. 416,000ක ගෙවිය යුතු ශේෂයක් නිරවුල් කිරීමකින් තොරව ගිණුම්වල දක්වා තිබුණි. තවද,වසර 05 ඉක්මවූ රු.7,610,160 ක ශේෂයක් අමාත්‍යාංශයෙන් ලැබිය යුතු ශේෂයක් ලෙස මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණද එවැනි ශේෂයක් ගෙවීමට ඇති බවට අමාත්‍යාංශ වාර්තාවලින් සනාථ නොවුණි. ඒ පිළිබඳ පසුවිපරම් කිරීමට කටයුතු කර නොතිබුණි.

(උ) රජයේ නිලධාරීන් බහුතරයක් ඇතුලුව 147 දෙනෙකුගෙන් පශ්චාත් උපාධි අධ්‍යයන පාඨමාලා ගාස්තු සහ ඉංග්‍රීසි වැඩසටහන් ගාස්තු ලෙස වර්ෂ 01ක සිට වර්ෂ 05 ක කාල පරාසයක් තුළ රු. 12,673,661 ක් අයවිය යුතුව පැවතිණි. අයදුම්කරුවන් පාඨමාලාවන් සම්පූර්ණ නොකර අත්හැර දමා ඇති බැවින් මෙම මුදල අය කර ගැනීම අවිනිශ්චිත වී ඇත.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමි යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 ආයතනයේ 2020 වාර්ෂික වාර්තාවේ ඇතුලත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබාගත් 2020 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ . මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මෙම විගණක වාර්තාවේ දිනට පෙර මා ලබාගත් අනෙකුත් තොරතුරු මත හා මා විසින් කරන ලද කාර්යයන් මත පදනම්ව, මෙම අනෙකුත් තොරතුරු ප්‍රමාණාත්මක වශයෙන් වැරදි ලෙස දක්වා ඇති බව මම නිගමනය කරන්නේ නම්, එම කරුණ මා විසින් වාර්තා කිරීමට අවශ්‍ය වේ. මේ සම්බන්ධයෙන් මට වාර්තා කිරීමට කිසිවක් නැත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක

සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය ආයතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව ඵලිත විගණන පරිපාටි සැලැසුම්

කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

2.1.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා ආයතනය පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (i) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට ආයතනය සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාළ ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

නීති රීති විධානයට යොමුව	නිරීක්ෂණය
(අ) 1971 අංක 38 දරණ මුදල් පනතේ 10 (05) වගන්තිය	විසර්ජනයකින් පසු ඉතිරි වන ශුද්ධ ආදායම ආපසු ඒකාබද්ධ අරමුදලට යැවිය යුතු වුවත් ආයතනය එයට අනුකූලව කටයුතු කර නොතිබුණි.
(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය: මුදල් රෙගුලාසි 757 (2)	සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන සමඟ භාණ්ඩ සමීක්ෂණ වාර්තා ඉදිරිපත් නොකෙරුණි.
(ඇ) 2003 ජූනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය (i) 5.1.1 වගන්තිය	ඉදිරි වර්ෂ තුනකට නොඅඩු කාලයක් සඳහා සංයුක්ත සැලැස්මක් පිළියෙල කල යුතු වුවද එවැනි සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.
(ii) 8.3.3 වගන්තිය	දිරිදීමනා පටිපාටිය සකස් කර මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා ගත යුතු වුවත් එසේ අනුමැතිය ලබා ගැනීමකින් තොරව සමාලෝචිත වර්ෂයේදී ද රු.3,202,850ක් ආයතනයේ කාර්ය මණ්ඩලය වෙත ගෙවා තිබුණි.
(ඇ) 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය	චක්‍රලේඛය ප්‍රකාරව ස්ථාවර වත්කම් ලේඛනයක් යාවත්කාලීනව පවත්වා නොතිබුණි.

(ඉ)	2009 නොවැම්බර් 13 දිනැති අංක 438 දරන රාජ්‍ය මුදල් වක්‍රලේඛ හි 05 ඡේදය	2018 හා 2019 යන වර්ෂයන්හි වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල මඟින් විකිනීම හෝ විනාශ කිරීමට නිර්දේශිත භාණ්ඩ විගණන දිනය වන විටත් ඉවත් කිරීමකින් තොරව ගබඩාවල පැවතුණි.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව

2.2.4 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීති, රීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව

3. අනෙකුත් කරුණු

(අ) 2013 අප්‍රේල් 19 දිනැති අංක අමප/13/0237/523/001 දරන අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි ද්විතීයන අධ්‍යයන කාර්ය මණ්ඩලය වෙත සියයට 50ක ද්විතීයන දීමනාවක් ගෙවා තිබුණි. එම දීමනාව ගෙවීම සඳහා 2014 නොවැම්බර් 14 දිනැති පොදු ව්‍යාපාර කාරක සභාවේදී මාසිකව ඉටුකල යුතු අවම දේශන පැය ප්‍රමාණය පැය 45 ක සීමාව වෙත ලඟාවිය යුතු බවට තීරණය කර තිබුණි. එහෙත් එම තීරණයට පටහැනිව, 2015 ජූලි සිට 2020 දෙසැම්බර් 31 දින දක්වා අවම දේශන පැය ගණන ආවරණය නොකරන ලද දේශකවරයන්ගෙන් අයකර ගත යුතු රු. 9,389,325ක් අයකරගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2008-2010 කාලපරිච්ඡේදයට අයත් පශ්චාත් උපාධි පාඨමාලාව 2014 වර්ෂයේ උපාධි ප්‍රදානෝත්සවය පවත්වා අවසන් කර තිබුණි. එහෙත් මෙම උපාධි පාඨමාලාව සඳහා සමාලෝචිත වර්ෂයේදී වාර්තාවක් සකස් කර ඉදිරිපත් කිරීම වෙනුවෙන් රු.1,432,463ක් කාර්ය මණ්ඩලය වෙත විධිමත් අනුමැතියකින් තොරව ගෙවා තිබුණි. මෙම ගෙවීම් සැලසුම් හා භාරදීමේ කමිටුවේ අනුමැතිය පරිදි සිදු කර තිබුණද මෙලෙස සැලසුම් හා භාරදීමේ කමිටුවක් මඟින් ගෙවීම් අනුමත කිරීම සම්බන්ධව භාණ්ඩාගාර අනුමැතිය ලද "බාහිර සේවා සඳහා වූ නීති සංග්‍රහයේ (Rules relating to external Services)" ඇතුලත් කර නොතිබුණි.

(ඇ) 2018 වර්ෂයේදී සංධරණි පර්යේෂණ මධ්‍යස්ථානය රු. 3,443,672 ක් වැයකර නවීකරණය කර තිබුණු අතර, එය පර්යේෂණ මධ්‍යස්ථානයක් වශයෙන් භාවිතයට නොගෙන මධ්‍යස්ථානය හා අනෙකුත් විද්‍යුත් උපකරණ ආයතනයේ පුහුණු කටයුතු සඳහා භාවිතා කිරීම හේතුවෙන් මධ්‍යස්ථානය පිහිටුවීමේ අරමුණ ඉටු වී නොතිබුණි.

(ඈ) විදුලිජනක යන්ත්‍රයට අවශ්‍ය ඉන්ධන ගබඩා කිරීම සඳහා ලීටර් 10000 ක ධාරිතාවයකින් යුත් ඉන්ධන ටැංකියක් ස්ථාපිත කර ඇති අතර සංස්ථාවෙන් ඉන්ධන ලබා ගැනීමේදී ලීටර් 6000 ක් එකවර ලබාගත යුතු වීම හේතුවෙන් එම ප්‍රමාණය ගබඩා කර තිබුණි. එම ඉන්ධන තොගයෙන් තවදුරටත් ඉන්ධන ලීටර් 2784 ක් ඉතිරිව පවතින බව නිරීක්ෂණය වූ අතර වාර්ෂික සාමාන්‍ය දහනයවීම අනුව තවත් අවුරුදු 10 කට වැඩිකාලයකට එය ප්‍රමාණවත් වන බව නිරීක්ෂණය වූ අතර දැනට මෙම ඉන්ධන තොගය භාවිතා කල නොහැකි මට්ටමේ පැවතිණි.

(ඉ) ආයතනය සතු නිලනිවාස 05ක් භාවිතයට ගැනීමකින් තොරව නිශ්ක්‍රීයව පවතින බව නිරීක්ෂණය විය.

(ඊ) 2013 පෙබරවාරි 07 දිනැති අංක 13/0150/523/005 දරන අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි ආයතනය පිහිටවනු ලැබූ පනත සංශෝධනය කිරීමට අනුමැතිය ලබා දී තිබුණ ද එම තීරණය ලැබී වර්ෂ 7ක් ගතවී ඇතත් ඒ සම්බන්ධයෙන් කිසිදු ක්‍රියා මාර්ගයක් ගෙන නොතිබුණි.

ඩබ්ලිව්.ජී.සී වික්‍රමරත්න

විගණකාධිපති



රාජ්‍ය පරිපාලන හා කළමණාකරණය පිළිබඳ දැනුම හා කුසලතා වර්ධනය කිරීම සඳහා ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම රාජ්‍ය අංශයේ පුහුණු ආයතනයයි. කළමනාකරණ පුහුණුවලට අමතරව කළමනාකරණ උපදේශන සේවා සැපයීම හා පර්යේෂණ කළමනාකරණයට අදාල සේවා සැපයීම මෙන්ම ආයතනික කළමනාකරණ ක්‍රමවේදයන් සමාලෝචනය හා වැඩිදියුණු කිරීම ද මෙම ආයතනයේ කාර්යභාරයට අයත් වේ. මෙය 1982 අංක 09 දරණ පාර්ලිමේන්තු පනත යටතේ පිහිටුවනු ලැබූ ආයතනයකි.

என்பது, பொது நிர்வாகம் மற்றும் முகாமைத்துவத்தில் அறிவை மேம்படுத்துவதற்கும் திறன்களை மேம்படுத்துவதற்கும், இலங்கையின் முதன்மையான பொதுத்துறை பயிற்சி நிறுவனமாகும். முகாமைத்துவ பயிற்சி நடவடிக்கைகளுக்கு மேலதிகமாக, ளுடுஜனுயு ஆனது முகாமைத்துவ ஆலோசனை சேவைகள் மற்றும் முகாமைத்துவத்தின் அடையாளம் காணக்கூடிய செயற்பாட்டுப் பகுதிகளை அபிவிருத்தி செய்வதற்கும் நிறுவன அமைப்புகளை மீளாய்வு செய்வதற்கும் மேம்படுத்துவதற்கும் மேற்கொள்ளும்.

Sri Lanka Institute of Development Administration (SLIDA) is the premier public sector training organization in Sri Lanka, for the development of knowledge and improvement of skills in Public Administration and Management. In addition to management training activities the SLIDA also undertakes Management Consultancy Services and Research to develop identifiable functional areas of management as well as review and improve organizational systems.

ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය
இலங்கை அபிவிருத்தி நிருவாக நிறுவகம்
Sri Lanka Institute of Development Administration

28/10 Malalasekara Mawatha, Colombo 07, Sri Lanka.
Tel: +94 (0) 115980200 Fax: +94 (0) 115898502
Email: mail@slida.lk Web: www.slida.lk

PRINTEC | 0112 815 816